පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 492

මාතර දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන

පාර්ලිමේන්තුවේ රජයේ ඇඟුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

Parliamentary Publication Series Number : 492

Local Government Institutions in Matara District

Submission to Parliament of the observations and action taken by the Hon. Minister in charge of Institutions under Standing Order No. 119(4) regarding the reports tabled by the Committee on Public Accounts of Parliament.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் எண் : 492

மாத்தறை மாவட்டத்தில் உள்ள உள்ளூராட்சி நிறுவனங்கள்

பாராளுமன்றத்தின் பொதுக் கணக்குகள் குழுவால் தாக்கல் செய்யப்பட்ட அறிக்கைகள் தொடர்பாக, நிலையான ஆணை எண் 119(4)-இன் கீழ் நிறுவனங்களுக்குப் பொறுப்பான மாண்புமிகு அமைச்சரால் எடுக்கப்பட்ட அவதானிப்புகள் மற்றும் நடவடிக்கை குறித்த பாராளுமன்றத்திற்கான சமர்ப்பிப்பு.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම - මාතර මහා නගර සභාව

රජයේ ගිණුම් කාරක සභාව විසින් කාර්යසාධන ඇගයීම ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
පළමු කොටස : 73.00	
සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පෙබරවාරි 28 දිනයට පෙර ඉදිරිපත් කර නොතිබුණි.	සමාලෝචිත වර්ෂය සඳහා(2023) මූල්‍ය ප්‍රකාශන කට්ටලය නිසි පරිදි සකස් කර විගණනය වෙත නියමිත දිනට (2024.02.29 දින) ඉදිරිපත් කළ ද මූල්‍ය ප්‍රකාශන කට්ටලය සමග ඉදිරිපත් කළ යුතු උපලේඛන වල අඩුපාඩු පැවති බැවින් ඒවා නිසි පරිදි සකස් කර ඉදිරිපත් කරන ලෙසට විගණනය විසින් දන්වා තිබූ බැවින් (ඇමුණුම 01) ඒවා සකස් කර 2024.03.26 දින (ඇමුණුම 02) විගණනය වෙත නැවත ඉදිරිපත් කරන ලදි. එසේම 2024 සහ 2025 වර්ෂ සඳහා මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට විගණනය සඳහා ඉදිරිපත් කර ඇති බව ද කාරුණිකව දැනුම් දෙමි.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/අභිතකර මට්ටමේ විය.	සමාලෝචිත වර්ෂය සඳහා (2023) මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන කට්ටලය සඳහා තත්වාගණනය කළ මතයත් ලබා දී තිබූ අතර, මතය සඳහා පදනම කොටසේ විස්තර කර තිබූ කරුණු වලින් වන බලපෑම හැර; මූල්‍ය ප්‍රකාශන වලින් 2023.12.31 දිනට මාතර මහා නගර සභාවේ මූල්‍ය තත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය තත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධරණ තත්වයක් පිළිඹිඹු කරන බව විගණනයේ මතය විය.
මිනුම් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	යාවත්කාලීන කරිමින් පවත්වා ගෙන යනු ලැබේ.
දුව්‍ය ආපසු භාරදීමේ ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	තොග ගබඩාව මඟින් නැවත භාරදී නැවත භාණ්ඩ භාරගැනීම Return Note පත්‍රයක් මඟින් සිදුවන අතර භාවිතයට සුදුසු භාණ්ඩ

නිතිඥ ජයන්ත කේ.ඩබ්. පතිරණ
(විද්‍යාවේදී, නීතිවේදී)
නගරාධිපති
මාතර මහා නගර සභාව
මාතර දිස්ත්‍රික්කය සඳහා නීල හොලත්
මහේස්ත්‍රාත් සහ සාම විනිසුරු

.	ලැබීමක් ලෙස බින් කාඩ් වලට ඇතුළත් කර ගැනීම සිදුවේ.භාවිතයට නුසුදුසු නැවත භාරගන්නා ද්‍රව්‍ය අඩලි භාණ්ඩ ලේඛනයට ඇතුළත් කරයි. ද්‍රව්‍ය ආපසු භාරදීමේ ලේඛනය ඉදිරියේදී පවත්වාගෙන යාමට කටයුතු කරමි.
ගල් හා බොරළු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනය පවත්වා නොතිබිණි. .	ගල් හා බොරළු ඇතුළු කර්මාන්ත භාණ්ඩ සහ අනෙකුත් සියලු භාණ්ඩ මේ වන විට නිවරදිව බින්කාඩ් වලට ඇතුලත් කර යාවත්කාලීන කරමින් පවතී. ඊට අමතරව මේවන විට ගබඩා භාණ්ඩ දත්ත ඇතුලත් කිරීම සඳහා මෘදුකාංගයක් පවත්වා ගෙන යන අතර කර්මාන්ත ද්‍රව්‍ය හැර සියලුම දත්ත දැනටමත් යාවත්කාලීන කර ඇති අතර, කර්මාන්ත භාණ්ඩ එයට ඇතුලත් කිරීමට කටයුතු කරමින් පවතින බවද කාරුණිකව දන්වමි.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම පිළිතුරු සපයා නොතිබුණි.	විගණන විමසුම් සඳහා නිසි කාල සීමාව තුළ පිළිතුරු ලබා දීමට කටයුතු කරමි. මේ වන විට පිළිතුරු සකස් කරමින් පවතින විගණන විමසුම් ගණන 02 කි.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	අභ්‍යන්තර විගණන වාර්තා සඳහා පිළිතුරු සැපයීම සිදු කරයි.
මු. රෙ. ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. .	අභ්‍යන්තර විගණන වාර්තාවන්හි පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම සිදු කරයි.
විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 4ක් වත් පවත්වා නොතිබුණි.	2023 වර්ෂයේ තුන්වන විගණන කළමනාකරණ කමිටුව 2023 නොවැම්බර් මස 10 වන දින පවත්වා ඇති බැවින් ඒම වර්ෂය තුළ තවත් විගණන කළමනාකරණ කමිටුවක් පැවැත්වීම සඳහා කාලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් 2023 වර්ෂයේ විගණන කළමනාකරණ කමිටු 03ක් පමණක් පැවැත්වීම සිදු කරන ලදි.නමුත් 2026 වසරේ සිට ඉදිරියේදී සෑම වසරකම විගණන කළමනාකරණ කමිටු 04ක් පැවැත්වීමට කටයුතු සූදානම් කරමින් පවතී. .

විජිදු ජයන්ත කේ.එස්. පතිරණ
විද්‍යාවේදී, නීතිවේදී)
නගරාධිපති
මාතර මහා නගර සභාව
මාතර දිස්ත්‍රික්කය සඳහා නීල නොලත්
මහේස්ත්‍රාත් සහ සාම විනිසුරු

සියළු වත්කම්වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	මාතර මහා නගර සභාව සතු මැනුම් නොකරන ලද හඳුනාගෙන ඇති ඉඩම් කොටස් මැනුම් කිරීමට කටයුතු කරමින් පවතින අතර, මේ වනවිට ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් මිනින්දෝරුවරුන් මඟින් මැනුම් කටයුතු ආරම්භ කර ඇත.
පවරා නොගත් වත්කම් තිබුණි.	පවරා නොගත් මාතර මහා නගර සභාව සතු සියළු වත්කම් පවරා ගැනීමට කටයුතු කරමින් පවතී.
වාහනයක් ගර්හිත වී මාස 08 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	අපහරණය කර අවසන් කර ඇත.
වර්ෂයට අදාලව බිල් කළ ආදායමෙන් අය කිරීම පහළ මට්ටමක විය .	වර්ෂයට අදාළව බිල් කළ ආදායමෙන් අය කිරීම පහළ මට්ටමක විය. **වරිපනම්** 2023 වර්ෂයට අදාළව වරිපනම් බිල් කළ ආදායම = රු. 64,208,468.88 2023 වර්ෂයට අදාළව බිල් කළ ආදායමෙන් අය කළ ප්‍රමාණය= රු. 24,632,635.56 • වර්ෂයට අදාළව බිල් කළ ආදායමෙන් අයවීම් ප්‍රතිශතය = 72% **හිඟ ආදායම් ප්‍රගතිය.** කඩ බදු කුලී හා වෙනත් 2023 වර්ෂයේ 12.31 දිනට හිඟ ආදායම් ලෙස රු.171,728,894 පවතින අතර ඉන් 2024 වර්ෂයේ රු. 76,105,764 ප්‍රමාණයක් අය කර ගැනීමට කටයුතු කර ඇත. 2025 වර්ෂයේ එම හිඟ ආදායම හා බිල් කිරීම් ද ඇතුලත්ව මුලු අය කළ යුදල ද රු.349,208,406 ක් වේ. එම අගයෙන් මේ වන විට අය කර ගන්නා ලද මුදල රු.262,001,447ක් වේ.තව දුරටත් අය කළ යුතු හිඟ මුදල රු.87,206,959 ක අගයකි . ඒ අනුව අය කර ගැනීමේ ප්‍රගතිය 75% කි.ඉතිරි හිඟ බදු මුදල් ද අය කර ගැනීමේ ක්‍රමවේදය මේ වන විට ක්‍රියාත්මක වේ.ඒ අනුව සියලුම හිඟ බදුකරුවන් වෙත අවසන් නිවේදන නිකුත් කර ඇති අතර ඒ සඳහා ප්‍රතිචාර නොදක්වන බදුකරුවන්ගේ සන්තකය නැවත සභාව සතු කර ගැනීමටත් හිඟ බදු මුදල් සඳහා නඩු දැමීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කර ගෙන යනු ලැබේ.

හිතිඳු ජයන්ත කේ.එස්. පතිරණ
(විද්‍යාවේදී, නීතිඥ)
නගරාධිපති
මාතර මහා නගර සභාව
මාතර දිස්ත්‍රික්කය සඳහා නීල නොලත්
මහේස්ත්‍රාත් සහ සාම විනිසුරු

ව්‍යාපාර බලපත්‍ර ලබා නොගත් ආයතන සඳහා නඩු පැවරීමක් සිදු කර නොතිබුණි.	2023.12.31 වන විට ව්‍යාපාර බලපත්‍ර හිඟ ඒකක 98 ක් පැවති අතර, ඉන් ඒකක 24 ක් සඳහා කාර්යාලයට මුදල් ගෙවා ඇත. තවත් ඒකක 6 ක් ද්විගණන දෝෂ හේතුවෙන් හිඟ ලැයිස්තුවෙන් ඉවත් කර ඇත. ඒකක 63 ක් සඳහා නඩු පවරා ඇත. ඒකක පහක් සඳහා පමණක් නඩු පවරා නොමැති අතර එම ඒකක 05 සඳහා නඩු නොපැවරීමට අදාළ නිලධාරීන්ගෙන් හේතු විමසීමට ද , ඒ අනුව ඉදිරි නඩු පවැරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වමි.

විජිත ප්‍රසන්න කේ.එස්. පඩිරණ
(විද්‍යාවේදී, නීතිවේදී)
නගරාධිපති
මාතර මහා නගර සභාව
මාතර දිස්ත්‍රික්කය සඳහා නීල නොලත්
මහේස්ත්‍රාත් සහ සාම විනිසුරු

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම - මාතර මහා නගර සභාව

රජයේ ගිණුම් කාරක සභාව විසින් කාර්යසාධන ඇගයීම ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
දෙවැනි කොටස: 41.00	
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	මාතර මහා නගර සභාවේ සේවාවන් වඩාත් කාර්යක්ෂම, විනිවිදභාවයෙන් යුක්ත හා මහජන හිතකාමී අයුරින් ජනතාව වෙත සමීප කිරීමේ අරමුණින් නව නිල වෙබ් අඩවියක් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු මේ වන විට ආරම්භ කර ඇත.
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	තාක්ෂණික කමිටුවක් මඟින් ආයතනයේ වත්මන් හා අනාගත තොරතුරු තාක්ෂණ අවශ්‍යතා, මහජන සේවා අවශ්‍යතා සහ ඩිජිටල් පරිවර්තන ඉලක්ක පිළිබඳ අධ්‍යයනයක් සිදු කර එම අධ්‍යයනයේ ප්‍රතිඵල මත පදනම්ව වෙබ් අඩවිය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික පිරිවිතර (Technical Specifications) සකස් කර ඇති අතර, ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාම සඳහා අදාළ ලේඛන ප්‍රසම්පාදන අංශය වෙත යොමු කර ඇත. යෝජිත නිල වෙබ් අඩවිය මඟින් මාතර මහා නගර සභාව විසින් ජනතාව වෙත සපයනු ලබන සේවාවන්, සංවර්ධන ව්‍යාපෘති, මහජන නිවේදන, ටෙන්ඩර් දැන්වීම්, විශේෂ වැඩසටහන් සහ අනෙකුත් ප්‍රවෘත්ති පිළිබඳ නිරන්තරයෙන් යාවත්කාලීන තොරතුරු ලබාදීමට සැලසුම් කර ඇත. එසේම, පළාත් පාලන අමාත්‍යාංශය විසින් හඳුන්වා දී ඇති **Local Government Performance Management System (LGPMS)** පද්ධතිය සහ **Smart City පැමිණිලි කළමනාකරණ පද්ධතිය** හරහා මහජනතාවට සපයනු ලබන ඩිජිටල් සේවාවන් පිළිබඳ දැනුවත් කිරීම හා ප්‍රවේශ පහසුකම් ලබාදීම සඳහා ද යෝජිත නිල වෙබ් අඩවිය භාවිතා කිරීමට සැලසුම් කර ඇත. තවද, මහජනතාවට අවශ්‍ය අයදුම්පත්, ආකෘති

නිශාන්ත ජයන්ත කෝරාළ
(විද්‍යාවේදී, ශ්‍රීකැලණිය)
නගරාධිපති
මාතර මහා නගර සභාව
මාතර දිස්ත්‍රික්කය සඳහා නිල නොලත්
මහේක්ෂාත් සත සාම විනිසුරු

	පත්‍ර සහ අනෙකුත් ලේඛන මාර්ගගතව බාගත කර ගැනීමේ පහසුකම් මෙම වෙබ් අඩවිය තුළින් සැලසීමට නියමිතය. මීට අමතරව, මහජන අදහස්, යෝජනා, පැමිණිලි සහ ප්‍රතිචාර ඍජුවම මහා නගර සභාව වෙත ඉදිරිපත් කිරීම සඳහා පද්ධතියක් මෙම වෙබ් අඩවිය තුළ ඇතුළත් කිරීමට සැලසුම් කර ඇත. එමඟින් ජනතාව හා මහා නගර සභාව අතර සන්නිවේදනය ශක්තිමත් කිරීම, මහජන සහභාගීත්වය ඉහළ නැංවීම සහ ජනතා අවශ්‍යතා කඩිනමින් හඳුනාගෙන ඒ සඳහා ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වැඩිදියුණු කිරීම අපේක්ෂිතය.
ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩපිළිවෙළක් නොතිබුණි.	• පළාත් පාලන ආයතන සහ මධ්‍යම පරිසර අධිකාරිය එක්ව ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එක්රැස් කිරීම් කටයුතු 2024 සහ 2025 වර්ෂයන්හිදී සංවිධානය කරන ලදී. • 2024 වර්ෂයේ ජුනි මස 03 සහ 04 දෙදින තුළ මාතර උයන්වත්ත පාපන්දු ක්‍රීඩාංගනයේ තාවකාලික එක්රැස් කිරීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එක්රැස් කර ගන්නා ලදී. • එමෙන්ම 2025 වර්ෂයේ ජුනි මස 11 සහ 12 දෙදින තුළ මාතර උයන්වත්ත පාපන්දු ක්‍රීඩාංගනයේ තාවකාලික එක්රැස් කිරීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එක්රැස් කර ගන්නා ලදී. • මෙලෙස එක්රැස් වූ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය නිසි පරිදි මධ්‍යම පරිසර අධිකාරිය වෙත භාර දීමට කටයුතු කරන ලදී. • 2026 වර්ෂය සඳහා ද ජුනි මස අවසන් වීමට ප්‍රථම මෙම කාර්ය අවසන් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

ඩී.ඒ.ඒ. ප්‍රියන්ත කේ.එස්. පතිරණ
(විද්‍යාවේදී, නීතිවේදී)
නගරාධිපති
මාතර මහා නගර සභාව
මාතර දිස්ත්‍රික්කය සඳහා නිල නොලත්
මහේස්ත්‍රාත් සහ සාම විනිසුරු

කසළ අපහරණය කිරීම /කසල කළමනාකරණය කිරීම සඳහා සහාව විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර නොතිබුණි.	• මාතර මහා නගර සභා බල ප්‍රදේශය තුළ ජනනය වන කසළ වර්ගීකරණය කර ලබාගැනීම වෙනුවෙන් ප්‍රජාව දැනුවත් කිරීම සඳහා නිවේදනයක් සකස් කර ඇති අතර, ප්‍රජාව දැනුවත් කිරීම මගින් කසළ වර්ගීකරණය කර ලබාගැනීමේ වැඩසටහන තවදුරටත් සක්‍රීය කරගැනීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඇත. • ඒ අනුව දිරන කසල සඳුදා, අඟහරුවාදා, සිකුරාදා සහ සෙනසුරාදා දිනවලදීත් , නොදිරන කසල බදාදා සහ බ්‍රහස්පතින්දා දිනවලදීත් වර්ගීකරණය කර ලබා ගැනීම සිදු කරනු ලබයි. • දෛනිකව එකතු කරනු ලබන කසළ වර්ගීකරණය කර ලබා ගන්නා ලෙස සියළුම සෞඛ්‍ය පරිපාලක මහතුන් දැනුවත් කිරීම් කටයුතු කර ඇත. එසේම වෙන් කර ලබා ගන්නා කසල කොටවිල සහ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය වෙත බැහැර කිරීමේදී ඉඳුල් , පොල්කුඩු, එළවළු, පළතුරු හා දිරාපත් වන අපද්‍රව්‍ය කොම්පොස්ට් අංගනය වෙත යොමු කිරීමට උපදෙස් ලබා දීඇත. එමෙන්ම එම අපද්‍රව්‍ය භාවිතා කර කොම්පොස්ට් නිෂ්පාදනය කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. • ප්‍රතිවක්‍රීකරණය කළ හැකි මට්ටමේ පවතින පොලිතීන් ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිවක්‍රීකරණය කිරීමේ කටයුතු පවත්වා ගෙන යන අතර, ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ විකුණුම් කරනු ලැබේ. ප්‍රතිවක්‍රීකරණය කළ නොහැකි කසළ ප්‍රමාණය කසළ අංගනය වෙත යොමු කර කුලී පදනම මත යොදවන ලද එක්ස්කැවේටර් යන්ත්‍රය මගින් තුනී කර පස්වලින්

නිතිඥ ජයන්ත කේ.එස්. පරිරක්ෂ
(විද්‍යාවේදී, නීතිවේදී)
නගරාධිපති
මාතර මහා නගර සභාව
මාතර දිස්ත්‍රික්කය සඳහා ජිල්ලා කොලජ්
මහේස්ත්‍රාත් සහ සාම විනිසුරු

	වැසීම සිදුකරමින් පවතී.
පළාත් පාලන ආයතනයෙන් පරිසර බලපත්‍ර ලබාගත යුතු සියළු ආයතන පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි.	අංක 2264/18 හා 2022 ජනවාරි 27 වන බ්‍රහස්පතින්දා දිනැති ගැසට් නිවේදනයට අනුව පළාත් පාලන ආයතන විසින් බලපත්‍ර ලබා දිය යුතු කර්මාන්ත 39 ක් නම් කර ඇත. ඒ වන විට මාතර මහා නගර සභාව විසින් නව ගැසට් නිමේදනයට ඇතුළත් ආයතන 49 කට පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කර ඇත. මෙම ගැසට් පත්‍රයට අනුව නිකුත් කරන ලද කුඩා පරිමාණ දූෂකාරක කර්මාන්ත නියමිත කටයුතු සඳහා පාරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ පළාත් පාලන ආයතන සඳහා මාර්ගෝපදේශ සංග්‍රහය පරිදි ලබාදීමට නියමිතව ඇති මාර්ගෝපදේශය 2023 වර්ෂයේ මැදභාගයේ ලැබී ඇත. එබැවින් ඒතෙක් නව ගැසට් නිවේදනයට අනුව ලබාදිය යුතු නව බලපත්‍ර නිකුත් කිරීමට නොහැකි විය. මෙම නව ගැසට් නිමේදනයට අනුව වර්තමානය වන විට හඳුනාගත් කර්මාන්ත 39ට අයත් ආයතන 123ක් සඳහා වර්තමානය වන විට පාරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කර ඇත. 2022
මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය/නගර සභා ආඥා පනතේ 157 වගන්තිය/ ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.	පොදු සම්මත අතුරු ව්‍යවස්ථාව වැළඳගෙන ඇති බැවින් අතුරු ව්‍යවස්ථාව පනවා ගැනීමක් සිදු කර නැත.
පළාත් පාලන ආයතන විසින් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන නොමැත්තේ නම් සම්මත අතුරු ව්‍යවස්ථා සභාව විසින් සභා සම්මතයක් මඟින් පිළිගෙන, ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත්කර එය වැළඳගෙන නොතිබුණි.	1952 අංක 6 දරණ පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතින් පනවා ඇති පොදු සම්මත අතුරු ව්‍යවස්ථාව මාතර මහා නගර සභාව විසින් වැළඳගෙන ඇත.
අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් වාර්ෂික ක්‍රියාකිරි සැලැස්ම ට ඇතුළත් කර නොතිබුණි.	ඉදිරි සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු යොදා ඇත.

නිමිඳු ජයන්ත කේ.එස්. පතිරණ
(විද්‍යාවේදී, නීතිවේදී)
නගරාධිපති
මාතර මහා නගර සභාව
මාතර දිස්ත්‍රික්කය සඳහා නිල නොලැබ්
මහේස්ත්‍රාත් සහ සාම විනිසුරු

අතුරු ව්‍යවස්ථා පරිශීලනය කිරීම සඳහා මහජනතාවට ප්‍රවේශයක් සලසා දී නොතිබුණි.	මාතර මහා නගර සභාව විසින් වැළඳගන්නා ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා මාතර මහා නගර සභාවට අයත් කුමාරතුංග මුනිදාස මහජන පුස්තකාලයේ මේ වන විට මහජනතාවට පරිශලනය කිරීමට අවස්ථාව ලබා දී ඇත. • වාහන නතර කිරීම හා වාහන හැසිරවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව • ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව • මදුරුවන් හා රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
ආයතනයේ පුරවැසි /සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	අධීක්ෂණ ක්‍රමවේදයක් සකස් කර ඇත. .
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. .	2023 වර්ෂයේ කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොමැති බව පෙන්වා දීමෙන් පසු 2024 වර්ෂය සඳහා එක් එක් නිලධාරියාට අදාළව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව ඇති බව කාරුණිකව සඳහන් කරමි.
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	අතිරික්ත තනතුරුවලය අදාළව සාධාරණීකරණ වාර්තා මු.රෙ. 71 අයදුම්පත් මඟින් අනුමැතිය සඳහා යොමු කර ඇත. තවද, 2025 කාර්ය මණ්ඩල සමාලෝචන වාර්තාවට ද ඇතුළත් කරන ලදි.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබුණු පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2023 වර්ෂයේ සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% අඩු මට්ටමක පැවතුනද 2024,2025 වර්ෂවල පුහුණු සැලැස්මේ සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් 50% වඩා වැඩි ප්‍රමාණයක් සපුරා ගැනීමට හැකි වූ බව කාරුණිකව සඳහන් කරමි.
විගණන වාර්තාවේ නිර්දේශ කර ඇති ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	නිර්දේශ වලින් කොටසක් ක්‍රියාත්මක කර ඇති අතර, ඉතිරි නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. .
2020.08.28 දිනැති අංක 02/2020	හඳුනාගෙන ඇත.

ගිහිඳු ජයන්ත කේ.එස්. පතිරණ
(විද්‍යාවේදී, කළමනාකරණ)
නගරාධිපති
මාතර මහා නගර සභාව
මාතර දිස්ත්‍රික්කය සඳහා නීතී කොමසාරිස්
මහේන්ද්‍රාස් සහ සාම් එසියුරස්

දරන රජය මුදල් වක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්ය සාධක දර්ශක 03 ක් හඳුනා ගෙන නොතිබුණි.	• පුහුණු වැඩසටහන් • ආදායම් රැස්කිරීම හා ආදායම් කළමණාකරණය • සන අපද්‍රව්‍ය කළමනාකරණය • මාර්ග හා පොදු යටිතල පහසුකම් නඩත්තුව
අය කළ යුතු අධිභාර අය කර නොතිබුණි.	2022 වර්ෂයේදී මාතර මහා නගර සභාව වෙත ඉදිරිපත් වී ඇති අධිභාර 03ට අදාළ අභියාචනා තීරණ ලැබී ඇත්තේ 2025 වර්ෂයේදී වන බැවින්, 2025 වර්ෂයේ සිට මේ දක්වා රු. 97,953.35ක මුදලක් අය කර ගෙන ඇති අතර, අය කළ යුතු ඉතිරි අධිභාර මුදල් අය කර ගැනීමට කටයුතු කරමින් පවතී.

ජයන්ත කේ.එස්.පතිරණ

නගරාධිපති

මාතර මහා නගර සභාව

ජයන්ත කේ.එස්. පතිරණ
විද්‍යාවේදී, නීතිවේදී)
නගරාධිපති
මාතර මහා නගර සභාව
මාතර දිස්ත්‍රික්කය සඳහා නිල නොලත්
මහේස්ත්‍රාත් සහ සාම විනිසුරු

ඇමුණුම -1

මාතර මහා නගර සභාව
29 FEB 2024
MATARA MUNICIPAL COUNCIL

මගේ අංකය - SPLG/MT/A/2024/in/52

ජාතික විගණන උප කාර්යාලය,

මහා නගර සභාව,

මාතර.

2024 පෙබරවාරි දින.

නාගරික කොමසාරිස්,

මහා නගර සභාව,

මාතර.

මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීම - 2023

උක්ත ශීර්ෂය යටතේ ඔබ වෙත යොමු කරන ලද මගේ සමාංක හා 2023 දෙසැම්බර් 20 දිනැති ලිපිය හා බැඳේ.

02. එහෙත් 2023 පෙබරවාරි 29 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබූ මාතර මහා නගර සභාවේ 2023 මූල්‍ය ප්‍රකාශනවල පහත තොරතුරු ඉදිරිපත් කර නොමැති බැවින් මූල්‍ය ප්‍රකාශන භාර ගත නොහැකි අතර, එම අඩුපාඩු සකස් කර නැවත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.


(i) පහත ආදායම් ශීර්ෂවලට අදාල සාරාංශ කරන ලද හිඟ ආදායම් උපලේඛන

- වරිපනම් බදු
- වෙළෙඳ බලපත්‍ර ගාස්තු
- ව්‍යාපාර බදු
- දැන්වීම් පුවරු ගාස්තු
- නඩු පවරා ඇති දැන්වීම් පුවරු ගාස්තු
- නඩු පවරා ඇති වෙළෙඳ බලපත්‍ර ගාස්තු
- වීථි පහන් නඩත්තු ගාස්තු
- තානායම් කුලී
- මුද්දර ගාස්තු

ටී. ආර්. ඔවිනි උරේෂා
නාගරික ගණකාධිකාරී
මහා නගර සභාව

මුල් පිටපත හා සැ... සත්‍ය පිටපතකි.

(ii) ආදායම් හා වියදම් වලට අදාලව අයවැය ගත හා තථ්‍ය වටිනාකම් අතර විචලනය හා ඊට හේතු



කේ. කරුණාරත්න,

විගණන අධිකාරී,

ජ්‍යෙෂ්ඨසහකාර විගණකාධිපති වෙනුවට.

එච්. ආර්. ඔවිටි උරේපා
නාගරික ගණකාධිකාරී
මහා නගර සභාව
මාතර.

මුල් පිටපත හා සැසඳූ
සත්‍ය පිටපතකි.

දැනුම්දීම -II



විගණන අධිකාරි,
විගණන උප කාර්යාලය,
මාතර.

2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනය විගණනය වෙත ඉදිරිපත් කිරීම

ඔබගේ අංක :SPLG/MT/A/2023/in/52 හා 2023.12.20 දිනැති ලිපිය අනුව මහ නගර සභා ආඥා පනතෙහි 219 වගන්තිය අනුව 2023 වර්ෂයේ අවසාන ගිණුම විගණනය කිරීමේ අවශ්‍යතාවය ඉටු කිරීම සඳහා පිටපත් 02 කින් යුක්තව මේ සමග ඉදිරිපත් කරමි.

.....

නාගරික කොමසාරිස්,
මාතර මහ නගර සභාව

පිටපත්: 1.පළාත් පාලන සහකාර කොමසාරිස් - දකුණු පළාත - අ.කා.ස.

2. පළාත් පාලන කොමසාරිස් - දකුණු පළාත - අ.කා.ස.

3.ප්‍රධාන ලේකම් - දකුණු පළාත - අ.කා.ස.

එච්. ආර්. ඔවිනි උදේශ්‍ය
නාගරික ගණකාධිකාරි
මහා නගර සභාව
මාතර.

මුල් පිටපත හා සැසඳූ සත්‍ය පිටපතකි.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම :- වැලිගම නගර සභාව

රජයේ ගිණුම්කාරක සභාව විසින් කාර්යසාධන ඇගයීම් ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
පළමු කොටස : 56	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතයයටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/අභිතකර මට්ටමේ විය	2023 වර්ෂයේ විගණකාධිපති විසින් තත්ත්වාගණනය කළ මතයක් ලබා දී ඇත.
ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2023 වර්ෂයේ යාවත්කාලීනව පවත්වා ඇත.
ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	යාවත්කාලීන කිරීම් කටයුතු කෙරෙමින් පවතී
බඩු වට්ටෝරු ලේඛනය/පාරිභෝගික ද්‍රව්‍ය ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	2023 වර්ෂයේ යාවත්කාලීනව පවත්වා ඇත.
හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත	පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.
උපපත්‍රිකා පොත් ලේඛනය නිසිපරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2023 වර්ෂයේ යාවත්කාලීනව පවත්වා ඇත
අත්තිකාරම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි	2023 වර්ෂයේ යාවත්කාලීනව පවත්වා ඇත
ණයගැති ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2023 වර්ෂයේ යාවත්කාලීනව පවත්වා ඇත
ණයහිමි ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2023 වර්ෂයේ යාවත්කාලීනව පවත්වා ඇත
සභා තිරණ ලේඛනය යාවත්කිලීනව පවත්වා නොතිබුණි.	2023 වර්ෂයේ යාවත්කාලීනව පවත්වා ඇත
විරි පහන් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2023 වර්ෂයේ යාවත්කාලීනව පවත්වා ඇත
මිනුම් පොත් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	භාවිතයේ නොමැත. ක්ෂේත්‍ර සටහන් පොත් වල සටහන් කරනු ලබයි.
මාර්ග ඉන්වෙන්ට්‍රිය ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2023 වර්ෂයේ යාවත්කාලීනව පවත්වා ඇත
ඉඩම් කට්ටිකර විකිණීමේ බදු ලේඛනය ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	භාවිතා නොකරයි
ගොඩනැගිලි අයදුම්පත් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2023 වර්ෂයේ යාවත්කාලීනව පවත්වා ඇත
අනුකූලතා සහතික ලබාදීමේ ලේඛනය යාවත්කාලීනව පවත්වා නොමැත.	2023 වර්ෂයේ යාවත්කාලීනව පවත්වා ඇත
නැන්පත් ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2023 වර්ෂයේ යාවත්කාලීනව පවත්වා ඇත
සේවක ණය ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2023 වර්ෂයේ යාවත්කාලීනව පවත්වා ඇත
නඩු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	නඩු ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ.

යූ. ජේ. එම්. අන්‍රාස්

ඇස්තමේන්තු ලෙජරය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	භාවිතයේ නොමැත. පරිගණක පැවරුම්පත් භාවිතයෙන් සකස් කරනු ලබයි.
ද්‍රව්‍ය ආපසු භාරදීමේ ලේඛනය ලේඛනය නිසිපරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2023 වර්ෂයේ යාවත්කාලීනව පවත්වා ඇත
ගල් හා බොරළු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ගල්,වැලි,සිමෙන්ති ලේඛනයක් භාවිතා කරනු ලැබේ.
ප්‍රධාන සංයුත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	පිළියෙල කර ඇත.
සංයුත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කොට සභා සම්මත කර නොතිබුණි.	2025 වර්ෂයේ සිට ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කර ඇත.
සංයුක්ත සැලැස්මට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කොට සභා සම්මත කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේ සිට නිවැරදිව කිරීමට කටයුතු කරනු ලැබේ.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	2023 වර්ෂයේ අභ්‍යන්තර විගණන වාර්තා සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීමට නොමැත.
මු.රෙ.ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේ සිට නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.
විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 04 ක් වත් පවත්වා නොතිබුණි.	විගණන කළමනාකරණ කමිටු 03 ක් පවත්වා ඇත.
සියලු වත්කම්වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	මැනුම් කටයුතු සිදු කරමින් පවතී. වැට මායිම් යෙදීමට ඇත.
පවරා නොගත් වත්කම් තිබුණි	සියලු වාහන පවරා ගෙන ඇත.
වාහනයක් ගර්හිත වී මාස අටකට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී නොමැත.
සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	2024 වර්ෂයේ සිට පින්තාරු කර ඇත.
ජංගම ගිණුමේ අතිරික්ත මුදල් කාලීන තැන්පතු වල සුදුසු පරිදි ආයෝජනය කිරීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි.	2025 වර්ෂයේ සිට ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර ඇත.
වර්ෂයට අදාලව බිල්කළ ආදායමෙන් අයකිරීම් පහළ මට්ටමක විය.	වරිපනම් 2023 වර්ෂයේ බිල් කිරීමෙන් 63.63 % ක ප්‍රමාණයක් අයකර ඇත.
ටෙන්ඩර්මත වාර්ෂකව බදු දිය යුතු සභාවේ දේපල සමාලෝචිත වර්ෂය තුළදී එසේ සම්පූර්ණ ලෙස බදු දී නොතිබුණි.	2023 වර්ෂයට අදාලව බදු දෙනු ලබන දේපල බදු දී ටෙන්ඩර් නොගිය ඉතිරි වූ දේපල වන කප්පරතොට රේන්ද පළ සහ මහවීදිය මාළු සහ එළවළු වෙළඳ පොල අවස්ථා තුනකදී ටෙන්ඩර්පත් ඉදිරිපත් නොවූ බැවින් වැලිගම නගර සභාව මඟින් ආදායම් එකතු කිරීම් සිදු කරන ලදි.
දීර්ඝ කාලීනව බදු දිය යුතු දේපල සමහරක් එසේ බදු නොදුන් අවස්ථා විය.	දේපල සියල්ල බදු දී ඇත.
දීර්ඝ කාලීනව බදුදුන් දේපල සියල්ල සඳහා ගිවිසුම් ගතවී කටයුතු අවසන් කර නොතිබුණි.	මේ වන විට ගිවිසුම් ගතවී නොමැති කඩ කාමර 03 ක් ඇති අතර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් සකස් කර මහා සභාවට ඉදිරියේදී ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

.....
සභාපති
වැලිගම නගර සභාව

යූ. ජේ. එම්. අත්‍රාසු
සභාපති
නගර සභාව
වැලිගම.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම :- වැලිගම නගර සභාව

රජයේ ගිණුම්කාරක සභාව විසින් කාර්යසාධන ඇගයීම් ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
දෙවැනි කොටස : 47.5	
තොරතුරු නිලධාරියා/නිලධාරීන් සහ නම්කළ නිලධාරියා (අභියාචනා නිලධාරියා) පිළිබඳ දත්ත මහජනතාවට ප්‍රදර්ශනය කර නොතිබුණි.	මහජනතාවට ප්‍රදර්ශනය කිරීමට කටයුතු කර ඇත.
ආයතනය පිළිබඳව මහජනතාවට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	වෙබ් අඩවිය නිර්මාණය කර පවත්වාගෙන යනු ලැබේ.
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	මේ වන විට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීමට අවස්ථාව සලසා ඇත.
හඳුනාගත් තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක නියමකර නොතිබුණි.	දර්ශක හඳනා ගැනීමට කටයුතු කර ඇත
පළාත් පාලන ආයතනයෙන් පරිසර බලපත්‍ර ලබාගත යුතු සියලු ආයතන පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි.	2264/18 අංක දරණ 2022/01/07 දිනැති අති විශේෂ ගැසට පත්‍රයට අනුකූලව පරිසර බලපත්‍ර ලබාගත යුතු යැයි සමීක්ෂණයෙන් හඳුනා ගන්නා සියලු කර්මාන්ත සඳහා පරිසර බලපත්‍ර ලබා දීමට පියවර ගෙන ඇත.
මහ නගර සභා ආඥා පනතේ 272 වගන්තිය/නගර සභා ආඥා පනතේ 157 වගන්තිය/ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.	අතුරු ව්‍යවස්ථා පනවා ඇත.
අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.	වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කර ඇත
අතුරු ව්‍යවස්ථා පරිශීලනය කිරීම සඳහා මහජනතාවට ප්‍රවේශයක් සලසා දී නොතිබුණි.	මහජනතාවට ප්‍රවිශයක් සලකා දී ඇත.
මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කර ඇත.
අනුමත සිමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවාගෙන තිබුණි.	2023 වර්ෂයට අදාලව සංවර්ධන නිලධාරීන් අතිරික්තව සිටින අතර මෙම නිලධාරීන් ප්‍රධාන ලේකම් කාර්යාලය මඟින් මෙම සභාවට අනුයුක්ත කර ඇත.

ඒ. ජේ. එම්. අන්‍රාස්
සභාපති
නගර සභාව
වැලිගම.

2020.08.28 දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍ර ලේඛනයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්ය භාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිනුම් කළ හැකි කාර්ය සාධන දර්ශක 03 ක් හඳුනාගෙන නොතිබුණි.	හඳුනාගෙන ඇත

.....

සභාපති,

වැලිගම නගර සභාව

යූ. ජේ. එම්. අෆ්රාස්
සභාපති
නගර සභාව
වැලිගම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492
අයතනයේ නම - අකුරැස්ස ප්‍රාදේශීය සභාව

රජයේ ගිණුම් කාරක සභාව විසින් කාර්ය සාධන ඇගයීම ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
පළමු කොටස - 80.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය	2023 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය තත්ත්වාගණනය කළ මතයකි.
මිනුම් පොත් යවත්කාලීනව පවත්වා නොතිබුණි.	සියළු කර්මාන්ත සඳහා බිල්පත සමඟ මිනුම් පත්‍රය තාක්ෂණ නිලධාරී විසින් සහතික කර ඉදිරිපත් කරන බැවින් නැවත මිනුම් පොතක් යාවත්කාලීන කිරීමක් සිදු නොකරයි.
මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි.	යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි.
ඇස්තමේන්තු ලෙජරය යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි.	සියළු කර්මාන්ත සඳහා ඇස්තමේන්තුව තාක්ෂණ නිලධාරී විසින් සහතික කර ඉදිරිපත් කරන බැවින් නැවත ඇස්තමේන්තු ලෙජරයක් යාවත්කාලීන කිරීමක් සිදු නොකරයි.
ගල් බොරලු ලේඛනය නිසිපරිදි යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි.	යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි.
ප්‍රධාන සංයුත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	ප්‍රධාන සංයුත සැලැස්මක් පිළියෙල කර නැත.
සංයුක්ත සැලැස්මට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කොට සභා සම්මත කර නොතිබුණි.	2026 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කර මහසභාවේ අනුමැතිය ලබා ගෙන ඇත.
සංයුත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	සංයුත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර ඇත.
විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර ගණන 04ක් වත් පවත්වා නොතිබුණි.	2023 වර්ෂයේදී විගණන කළමනාකරණ කමිටු රැස්වීම් වාර 03 ක් පමණක් පවත්වා තිබුණි.
සියලු වත්කම්වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	මැනුම් කර ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු සිදුකරන අතර එසේ මැනුම් කරන ලද කැබලි කිහිපයක වැට මායිම් යොදන ලදි.
පවරා නොගත් වත්කම් තිබුණි.	පවරා ගැනීමට කටයුතු කරමි.

සමන් [illegible] ප්‍රේමවීර
සභාපති
අකුරැස්ස ප්‍රාදේශීය සභාව

සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	සියළු වාහනවල රාජ්‍ය ලාංඡන හා ප්‍රාදේශීය සභාවේ නම සඳහන් නාම පුවරුව ප්‍රදර්ශනය වන ලෙස ධාවනය කිරීම සිදු කෙරේ.
වර්ෂයට අදාළව බිල්කළ ආදායමෙන් අය කිරීම පහළ මට්ටමක විය.	2025/12/31 දිනට බිල්කළ ආදායමින් පහත පරිදි අයකර ඇත. කඩකුලී - 66% / වරිපනම් - 79% / වෙළඳ බලපත්‍ර - 100% / ව්‍යාපාර බදු - 88%
දීර්ඝ කාලීනව බදු දුන් දේපළ සියල්ල සඳහා ගිවිසුම් ගත වී කටයුතු අවසන් කර නොතිබුණි.	2023 වර්ෂය වන විට පැවති දීර්ඝ කාලීනව බදු දුන් දේපළවලින් 2026 වන විට 86 ක් ගිවිසුම්ගත වී ඇත.

සමන් කුමාර සුරවීර
සභාපති
අකුරැස්ස ප්‍රාදේශීය සභාව

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

අයතනයේ නම - අකුරැස්ස ප්‍රාදේශීය සභාව

රජයේ ගිණුම් කාරක සභාව විසින් කාර්ය සාධන ඇගයීම ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
දෙවන කොටස - 52.00	
හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක නියම කර නොතිබුණි.	තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා අකුරැස්ස ප්‍රාදේශීය සභාව මගින් අරමුණු 11ක් සහ ඉලක්ක 42ක් හඳුනාගෙන ඇති අතර ඒ සඳහා 2026 ජුනි මස මහාසභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමි.
ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩ පිළිවෙළක් නොතිබුණි.	ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය රැස් කිරීම සභාව විසින් සිදු නොවන අතර පරිසර අමාත්‍යාංශය මගින් වෙනම වැඩ සටහනක් වාර්ෂිකව සිදු කරන බැවින් ඒ සඳහා අපද්‍රව්‍ය රැස්කර ලබාදීම සිදු කරනු ලැබේ.
වරිපනම් කලාපය ඇතුළත ව්‍යාපාරික ස්ථාන වලින් හා ආයතන වලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අය කර නොතිබුණි.	කසල බදු පනවා ඇති අතර කසල බදු සේවාව ලබා ගැනීමට කැමැත්ත පළකළ ආයතන කිහිපයකින් කසල බදු අයකර ඇත.
මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය/ නගර සභා ආඥා පනතේ 157 වගන්තිය/ ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.	කෙටුම්පත් කර ඇති අතුරු ව්‍යවස්ථා සහකාර කොමසාරිස් මගින් අනුමැතියට යොමුකර ඇතත් මේ දක්වා අනුමැතිය ලැබී නැත.
2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ විධිවිධාන අනුව නිසිපරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.	2025 වර්ෂයට අදාළව මානව සංවර්ධන සැලැස්ම සකස්කර ඇත.

සමන් කුමාර සුරවීර
යහපති
අකුරැස්ස ප්‍රාදේශීය සභාව

සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	2025 වර්ෂයේ නිලධාරීන්ට සහ කණිෂ්ඨ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් දෙකක් පවත්වන ලදි. එසේම සියලුම කාර්ය මණ්ඩලය සඳහා එළිමහන් එක්දින පුහුණු වැඩසටහනක් සැලසුම්කළද පැවති අයහපත් කාලගුණය හේතුවෙන් එය පැවැත්වීමට නොහැකි විය.
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවා ගෙන තිබුණි.	කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේදී අනුමැතිය ලබාදීම සිදුකරන්නේ පළාත් සභාව මගින් වන බැවින් අනුමත සීමාව ඉක්මවා බඳවා ගැනීම් දිසුවී ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	ඉදිරි වර්ෂවලදී කාර්යමණ්ඩලය පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීමට කටයුතු කරමි.
2020.08.28 දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටුකළ යුතු කාර්යභාර්ය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිනුම් කළ හැකි කාර්යසාධක දර්ශක 03ක් හඳුනා ගෙන නොතිබුණි.	මේ වන විට හඳුනාගෙන ඇත.

සමන් කුමාර සුරවීර
සභාපති
අකුරැස්ස ප්‍රාදේශීය සභාව

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම - අතුරලිය ප්‍රාදේශීය සභාව

අනු අංකය	රජයේ ගිණුම් කාරක සභාව විසින් කාර්ය සාධන ඇගයීම් ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
පළමු කොටස : 79.00		
01.	ආයතනයේ ගිණුම් පිලිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය	2023 හා 2024 වර්ෂ දෙකේදීම ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, තක්වාගණනය කල මතයකි.
02.	මාර්ග ඉන්වෙන්ටරිය යාවත්කාලීනව පවත්වා නොතිබුණි	මාර්ග මැනුම් කටයුතු අවසන් කර ඉන්වෙන්ට්‍රි ලේඛණය සකස් කර අවසන් කර ඇත
03.	ඇස්තමේන්තු ලෙජරය නිසි පරිදි යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි. ගල් හා බොරලු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි. මිනුම්පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි	1988 මූල්‍ය හා පරිපාලන නීති වලට අදාලව 169 රීතියේ සටහන්ව ඇත්තේ මිනුම් පොත, ගල් හා බොරළු ලේඛනය, ඇස්තමේන්තු ලෙජරය නඩත්තු කල යුතුව ඇති බවය. ඉදිරියේ දී PS 43 අකෘතියට අනුව මිනුම් පොතක් ද, PS 42 ආකෘතියට අනුව ගල් හා බොරළු ලේඛනයද, ඇස්තමේන්තු ලෙජරය ද පවත්වාගෙන යාමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.
04.	සභාව විසින් වියදම් සීමාවන් තීරණය කර නගරාධිපති වරයා /සභාපතිවරයා සහ නිලධාරීන් වෙත පැවරීමක් සිදුකර නොතිබුණි. මූල්‍ය බලතල පැවරීම ප්‍රමාණවත් පරිදි ආයතනය තුළ සන්නිවේදනය කර නොතිබුණි	මේ වන විට බලතල පවරා ඇති අතර අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.
05.	මාසික වැටුප් ලේඛන සහ පාලන ගිණුම් තුලනය කර සහ අදාල සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි	මාසික වැටුප් ලේඛන සහ පාලන ගිණුම් තුලනය කර සහ අදාල සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර ඇත.
06.	මෘදුකාංගයට අදාල මුර පද තුන් මසකට වරක් වෙනස් කර නොතිබුණි	PAYROLL මෘදුකාංගයට අදාලව මුර පද මාරු කිරීමට කටයුතු කර ඇත
07.	සංයුත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	2023 වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර අනුමැතිය ලබාගෙන ඇත.

ආර්. එම්. සුදත්
අභ්‍යාසී
ආණ්ඩුක්‍රම ප්‍රාදේශීය සභාව
දොස්තර සුහිස්තර වසුමතීගේ මාවත
සිරිවෙහෙරුවාව - අනුරාධපුර

		2023 වර්ෂය වන විටනව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ භාවිත නොකල බව තවදුරටත් වාර්තා කරමි.
08.	විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් වාර 4ක් වත් පවත්වා නොතිබුණි.	2023 වර්ෂයේ විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් 03 ක් හා 2024 වර්ෂයේ විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් 02 ක් පවත්වා ඇත.
09.	සියළුම වත්කම් වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි. පවරා නොගත් වත්කම් තිබුණි.	• සියලුම වත්කම් වල ආරක්ෂාව තහවුරු නොකිරීම. I.තලහගම පොදු සුසාන භූමිය පිහිටි ඉඩම මෙම ඉඩම මැනුම් කටයුතු සිදු කර මායිම් නිරවුල් කිරීම සඳහා සුසාන භූමිය ලෙස අතුරලිය ප්‍රාදේශීය සභාව වෙත පවරා දීමට අදාළ ඉදිරි කටයුතු සඳහා අංක 2026/24 දරණ මැනුම් ඉල්ලීම් අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මාතර මිනින්දෝරු අධිකාරි වෙත ඉදිරිපත් කර ඇති බව අංක ATU/LND/01/DO/PS/02 හා 2026/03/30 දිනැති ලිපිය මගින් අතුරලිය ප්‍රාදේශීය සභාව වෙත දන්වා ඇත. ඒ අනුව එම ඉඩම් කොටස විධිමත්ව පවරා ගෙන වැට මායිම් යොදා අතුරලිය ප්‍රාදේශීය සභාව සතු ඉඩමකි යන නාම පුවරුව සවි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. II.තිබ්බොටුවාව හරුපාවිල ඉඩම හිමිකම් ඔප්පු හා පිඹුරුපත් ඇති ඉඩමකි . එහි පොදු වැසිකිළි ගොඩනැගිල්ලක් ඇත. ප්‍රවේශ වන මාර්ගය ඇත. එහෙත් ඒ ආසන්නයේම පදිංචි නිවසක් ඇති බැවින් මහජනයාට භාවිතය සඳහා ලබා දීමට හැකියාවක් නොමැත. අතුරලිය ප්‍රාදේශීය සභාව සතු ඉඩම් විධිමත්ව පවරා ගෙන ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇති අතර ඒ අනුව කටයුතු කරමින් මෙම ඉඩමේ නිවැරදිව මැනුම් කටයුතු සිදු කර මායිම් හඳුනාගෙන වැටක් යෙදීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. III.කනහලාගම ගල්වල ඉඩම හිමිකම් ඔප්පුවක් ඇති ඉඩමකි පිඹුරුපත් නැත. ඉඩම් සමීක්ෂණයේදී හඳුනා ගැනීමට අපහසු වී ඇත. මෙම ඉඩම සම්බන්ධ තොරතුරු විමසා 2025.03.18 දින අතුරලිය ප්‍රාදේශීය ලේකම් වෙත ලිපියක් යොමු කරන ලදි. ඒ අනුව අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාරයාලය මගින් 2025.06.23 දින අප ආයතනය වෙත එවන ලද පිළිතුරු ලිපිය අනුව, එම ඉඩම් කොටස මලවිගමගේ

එච්. එම්. සුවාන්
සභාපති
අතුරලිය ප්‍රාදේශීය සභාව
දොස්තර සුගීශ්වර මිතුමිණිගෙ මාවත
තිබ්බොටුවාව - අකුරැස්ස

		උදේනිස් නමැති අය විසින් එවකට පැවති ගම් සභාව වෙත පවරා දී ඇති ඉඩමක් බව ඔප්පු අනුව නිරීක්ෂණය වන බවද , එම ඉඩම සම්බන්ධව අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව පිඹුරු හෝ වෙනත් ලේඛන නොමැති බවත් බලයලත් මිනින්දෝරු වරයෙකු මඟින් මැන පිඹුරුපත් සකස් කර ගැනීම සුදුසු බව දන්වා ඇත. අතුරලිය ප්‍රාදේශීය සභාව සතු ඉඩම් විධිමත්ව පවරා ගෙන ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇති අතර ඒ අනුව කටයුතු කරමින් මෙම ඉඩමේ නිවැරදිව මැනුම් කටයුතු සිදු කර මායිම් හඳුනාගෙන වැටක් යෙදීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. IV.හෝන්දුවල ඉඩම හිමිකම් ඔප්පු ඇති ඉඩමකි. මහජනතාව භාවිතයට ගන්නා පොදු නාන ළිඳක් ඇත. අතුරලිය ප්‍රාදේශීය සභාව සතු ඉඩමකි යන නාම පුවරුව සවි කර ඇත. අතුරලිය ප්‍රාදේශීය සභාව සතු ඉඩම් විධිමත්ව පවරා ගෙන ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇති අතර ඒ අනුව කටයුතු කරමින් මෙම ඉඩමේ නිවැරදිව මැනුම් කටයුතු සිදු කර මායිම් හඳුනාගෙන වැටක් යෙදීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. V.ඌරුමුත්ත මිල්ලමුලගාව ඉඩම මෙම ඉඩමද ඔප්පු හා පිඹුරුපත් හිමි නිරවුල් හිමිකම් ඇති ඉඩමකි. ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කරමින් ඉඩමේ ආරක්ෂාව වෙනුවෙන් වැට මායිම් යෙදීමටත් , අතුරලිය ප්‍රාදේශීය සභාව සතු ඉඩමකි යන නාම පුවරුව සවි කිරීමටත් කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. VI.ඌරුමුත්ත පොල්පැල කොරටුව ඉඩම මෙම ඉඩමද ඔප්පු හා පිඹුරුපත් හිමි නිරවුල් හිමිකම් ඇති ඉඩමකි. එහි ජනතාව භාවිතයට ගන්නා ප්‍රජා ශාලාවක් ඇත. ඉඩමේ ආරක්ෂාව වෙනුවෙන් වැට මායිම් යෙදීමටත් අතුරලිය ප්‍රාදේශීය සභාව සතු ඉඩමකි යන නාම පුවරුව සවි කිරීමටත් කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. •පවරා නොගත් වත්කම් I. තිබ්බොටුවාව කඩ කාමර 14 පිහිටි ඉඩම II. තිබ්බොටුවාව ත්‍රිකෝණාකාර ඉඩම මෙම ඉඩම් කොටස් දෙකම එකතු කර

ඩබ්. එම්. සුමින්
සභාපති
අතුරලිය ප්‍රාදේශීය සභාව
දොස්තර සුමිත්‍රාව විමුලසිරිය මාවත
තිබ්බොටුවාව - අතුරලිය

		වෙළඳ සංකීරණය ඉදි කර ඇති බැවින් , ඉඩම් කොටස් දෙකම එක ඉඩමක් ලෙස රජයේ මිනින්දෝරු දෙපාරතමේන්තුවෙන් මැන පිඹුරුපත් සකස් කර දී ඇත. පැවරීම් සහතික අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාරයාලය මගින් ලබා දීමට කටයුතු සිදු කරමින් ඇති බව කාරුණිකව දන්වා සිටිමි. III.විල්පිට නැගෙනහිර විජයගිරි විහාරය ඉදිරිපිට ඉඩම විහාරාධිපති හිමියන් විසින් ලිපියක් මගින් පවරා දී ඇත. පිඹුරුපතක් නොමැත. මෙම ඉඩමේ පොදු ළිඳක් ඇත. එහි අවට එළි පෙහෙලි කර ඇත. අතුරලිය ප්‍රාදේශීය සභාව සතු ඉඩමකි යන නාම පුවරුව සවි කර ඇත. මෙම ඉඩම පවරා ගැනීම සම්බන්ධ තොරතුරු විමසා 2025.03.18 දින අතුරලිය ප්‍රාදේශීය ලේකම් වෙත ලිපියක් යොමු කරන ලදි. ඒ අනුව අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාරයාලය මගින් 2025.06.23 දින අප ආයතනය වෙත එවන ලද පිළිතුරු ලිපිය අනුව, මෙම ඉඩම සම්බන්ධයෙන් අතුරලිය ප්‍රාදේශීය ලේකම් සතුව ලේඛන නොමැති බවත්, විහාරාධිපති හිමියන්ගේ පැවරීම් ලිපිය අනුව එය විහාරස්ථානය සතු ඉඩමෙහි කොටසක් ප්‍රජා ශාලාවක් ඉදි කිරීම සඳහා විහාරාධිපති හිමියන් විසින් අකුරුස්ස ප්‍රාදේශීය සභාව වෙත පවරන ලද ඉඩමක් බවත් එහි දැනට භාවිතයට නොගන්නා පොදු නාන ළිඳක් ඇති බව ද නිරීක්ෂණය වන බැවින් , බෞද්ධ කටයුතු කොමසාරිස්ගේ අනුමැතිය මත විහාරාධිපති හිමියන් මගින් ඉඩම් කොටස ප්‍රාදේශීය සභාව වෙත නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කිරීම සුදුසු බව දන්වා ඇත. ඒ අනුව ඉදිරියේ දී එම ඉඩම් කොටස විහාරාධිපති හිමියන් මගින් නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි.
10.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	මේ වන විට ඌන අයකරගෙන ඇති අතර, ඌන අයකර ගැනීමට නොහැකි වූ භාණ්ඩ සඳහා පරීක්ෂණ කටයුතු කරගෙන යනු ලැබේ.
11.	සියළු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	සියළු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර ඇත.
12.	වර්ෂයට අදාලව බිල් කල	•වරිපනම් බදු - පවතින ආර්ථික අර්බුධය

ඩී.ඒ. එස්. සුදෙරා
සභාපති
අතුරලිය ප්‍රාදේශීය සභාව
දොස්තර සුගීශ්වර විතුරිසිංහ මාවත
පිටිබොවුවාව - අතුරලිය

	ආදායමෙන් අය කිරීම් පහළ මට්ටමක විය	හමුවේ ජනතාව බදු ගෙවීමට මැලිකමක් දක්වන අතර, නිරන්තර ගංවතුර තත්වයන්ට බල ප්‍රදේශය ලක්වීම නිසාද ජනතාව අර්බුධයකට පත්ව ඇත. නමුදු 2023 වර්ෂය තුල ජංගම සේවා හා ගෙන් ගෙට යාම් 14ක් පවත්වා 2023 වර්ෂය තුල බිල් කිරීම් වලින් රු. 185,521.12 ක මුදලක් අයකර ගෙන ඇත. රු. 216,302.40ක නිහ ශේෂයක් සඳහා රතු නිවේදන යවා ඇත. ගෙයින් ගෙට යමින් හා රතු නිවේදන යැවීම් මගින් නිහ වරිපනම් බදු ශේෂය අවම කර ගැනීමට කටයුත් කරමින් පවති. •කඩ කාමර - 2023 වර්ෂයට අදාලව කඩකාමර බිල්කිරීම් වලට අදාල සියළුම නිහ මුදල් ලැබී ඇත. •මාළු ලැලි - 2023 වර්ෂයේ මාළු ලැලි බිල් කිරීම් වලට අදාල රු. 52,400.00ක මුදල හැර අනෙකුත් සියළුම නිහ මුදල් ලැබී ඇති අතර රු. 52,400.00 මුදල සඳහා නඩු දමා ඇති අතර අදාල බදු කරු විදේශ ගත වී ඇති බැවින් එම නඩුව බහාතබා ඇත. •අක්කර බදු - 2023 වර්ෂයේ බිල්කල ආදායම හා ඊට අදාල අයවීම් පහළ යාමට හේතුවී ඇත්තේ, බදු අයකරන ඉඩම් පිළබඳ අයිතිකරුවන් සොයා ගැනීමට නොහැකිවීම හේතුවෙන් බදු අයකර ගැනීමට නොහැකි වීම හේතුවෙනි. වර්ෂය තුල අවස්ථා කිහිපයකදීම ලිපි මගින් හා ආදායම් පරීක්ෂක විසින් ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදු කර ඇත. මේ ව විටද ක්ෂෙත්‍ර පරීක්ෂාවන් සිදු කරමින් අදාල ඉඩම් හිමියන් හඳුනාගැනීමට අවශ්‍ය පියවරයන් ගනිමින් පවති. •වෙළඳ පලපත්‍ර - 2023 වර්ෂයේ නිහ බලපත්‍ර ගාස්තු නඩු පැවරීම් මගින් අයකර ඇත. •වෙළඳ බදු - 2023 වර්ෂයේ නිහ බලපත්‍ර ගාස්තු නඩු පැවරීම් මගින් අයකර ගෙන ඇත.

ආර්. එම්. කුඩාවේ
සභාපති
අනුරාධපුර ප්‍රාදේශීය සභාව
අලුත්නුවර සුමිත්වර විතානගේ ලේකම්
නිවාසකොටුවාව - අනුරාධපුර

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම - අතුරලිය ප්‍රාදේශීය සභාව

අනු අංකය	රජයේ ගිණුම් කාරක සභාව විසින් කාර්ය සාධන ඇගයීම් ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
දෙවැනි කොටස : 48.50		
01.	සභාවට අදාළ ප්‍රගාමී තොරතුරු ප්‍රදර්ශනය කර නොතිබුණි.	•ප්‍රගාමී තොරතුරු ප්‍රදර්ශනය කර ඇත
02.	ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි. ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි	•වෙබ් අඩවියක් සකස් කර ඇත. වෙබ් අඩවියෙහි මහජනතාවට යෝජනා, පැමිණිලි කිරීම සඳහා අවකාශ සලසා ඇත.
03.	හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක නියම කර නොතිබුණි.	•ජයග්‍රහණ දර්ශක නියම කර ඇති අතර මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතී.
04.	ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩ පිළිවෙලක් නොතිබුණි.	•ඉලෙක්ට්‍රොනික/යකඩ/කාඩ්බෝඩ්/ප්ලාස්ටික්/ඉටි යන අපද්‍රව්‍ය නොදිරන කසළ එකතු කරන අවස්ථාවේදී වර්ග කර සභා භූමියට ගෙන ඒම සිදු කරනු ලබයි.
05.	කසළ අපහරණය කිරීම/කසළ කළමණාකරනය කිරීම සඳහා සභාව විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.	•විධිමත් වැඩපිළිවෙලක් මේ වන විට ක්‍රියාත්මක වේ. දිරන හා නොදිරන ලෙස කසළ වෙන් කර ලබා ගන්නා අතර දිරන කසළ කොම්පොස්ට් සෑදීමට අකුරැස්ස ප්‍රාදේශීය සභාවට භාර දෙනු ලැබේ.
06.	ප්ලාස්ටික් සහ පොලිතීන්	•ප්ලාස්ටික්, පොලිතීන් වැනි ප්‍රතිචක්‍රීකරණය කල

සභාපති
අතුරලිය ප්‍රාදේශීය සභාව
දොස්තර පුෂ්පවර පතුරුසිංහ මාවත
මිරිස්සවිල්ලාව - අතුරලිය

	ප්‍රතිවක්‍රීකරණය සඳහා යොමු කිරීමේ සංවිධානාත්මක වැඩපිළිවෙලක් නොතිබුණි.	හැකි අපද්‍රව්‍ය අලෙවි කිරීමත් මාතර මහ නගර සභාව වෙත ලබා දීමටත් කටයුතු කරයි.
07.	අතුරු ව්‍යවස්ථා පරීශීලනය සඳහා මහජනතාවට ප්‍රවේශයක් සලසා දී නොතිබුණි.	•අතුරු ව්‍යවස්ථා පරීශීලනය සඳහා මහජනතාවට ප්‍රවේශයක් සලසා දී ඇත
08.	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවාගෙන තිබුණි	• අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා පහත තනතුරු යටතේ ස්ථිර සේවකයින් අප ආයතනයේ සේවයේ නියුතු බව කාරුණිකව දන්වා සිටිමි. ▯ සංවර්ධන නිලධාරී 15 ▯ රියදුරු 04 ▯ පුස්තකාල සහයක 02 • මේ වන විට සංවරධන නිලධාරී තනතුරු 15 අනුමත කර ගැනීමට ප්‍රධන ලේකම් විසින් කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවට ඉල්ලීම් කර ඇති බව දකුණු පළාත් කොමසාරිස්ගේ අංක 1/10/06/07(පොදු) හා 2024.05.08 දිනැති ලිපිය මගින් අපවෙත දැනුම් දී ඇත. •2024 ජුනි මාසයේ පත්වීම් ලබා දුන් රියදුරු තනතුරු 04 හා පුස්තකාල සහයක තනතුරු 02 දරන්නාට පෞද්ගලික වන සේ අනුමත කර ගැනීමට 2024.07.18 දින පළාත් පාලන සහකාර කොමසාරිස් මගින් අදාළ තොරතුරු ඉදිරිපත් කර ඇත. •එමෙන්ම 2025 වර්ෂයේ සිදු කළ කාර්ය මණ්ඩල සමාලෝචන වාර්තාවටද සේවා අවශ්‍යතා සැපයීමේදී අවශ්‍යතාව පවතින ඉහත තනතුරු ඇතුළත් කර ඇති බවද වැඩිදුරටත් දක්වමි.
09.	සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා පුමාණය 50% ට වඩා අඩු මට්ටම පැවතුණි	•2023 වර්ෂයේ සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා පුමාණය 50%ට වඩා අඩුවීමේ දුර්වලතාවය මහහරිමින් 2024 වර්ෂය සඳහා පුහුණු සැලැස්ම සකස් කිරීමේදී 2023 වර්ෂයට වඩා පුහුණු අවස්ථාවන් ඇතුලත් කිරීම සහ නිලධාරීන් වැඩි වශයෙන් පුහුණු වැඩසටහන් වෙත යොමු කර වීමට පියවරගන්නා ලදී.
10.	විගණන වාර්තාවේ නිර්දේශ කර ඇති ක්‍රියාත්මක කල හැකි නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි	•නිර්දේශ කර ඇති ක්‍රියාත්මක කල හැකි ඇතැම් නිර්දේශ ක්‍රියාත්මක කර ඇති අතර අනෙකුත් නිර්දේශ ක්‍රියාත්මක කරමින් පවතී

සභාපති
අඹුරැල්ල ප්‍රාදේශීය සභාව
දොස්සාර ප්‍රදීපේවර මැතිඇණන් මහතා
සිහිනොවුවාව - අඹුරැල්ල

11.	2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටුකළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්ය සාධන දර්ශක 03 ක් හඳුනාගෙන නොතිබුණි. පහත කාර්ය සාධන දර්ශක 03 ක් හඳුනාගෙන ඇත.	පහත කාර්ය සාධන දර්ශක 03 ක් හඳුනාගෙන ඇත. •හිඟ වරිපනම් මුදලින් වසරකට අවම 20%ක ප්‍රතිශතයක් අයකර ගැනීම. •වරිපනම් අයකරන ගෘහ ඒකක සියල්ලම ආවරණය වන පරිදි කසළ එක්රැස් කිරීම. •වසරකට මාර්ග 5km ක් මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය හෝ බැකෝ ලෝඩර් යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම.

අතුරලිය ප්‍රාදේශීය සභාව
දොස්තර සුමිත්වර මාලමඩිංය මාවත
සිඹාවොවුවාව - අකුරැස්ස

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම - මාතර ප්‍රාදේශීය සභාව

රජයේ ගිණුම්කාරක සභාව විසින් කාර්යසාධන ඇගයීම ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
පළමු කොටස : 82.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ,යටත්ව මට්ටමේ /ව්‍යාවන මට්ටමේ /අහිතකර මට්ටමේ විය.	තත්ත්වාගණනය කළ මතය ඉදිරිපත් කර ඇත.
ද්‍රව්‍ය ආපසු භාරදීමේ ලේඛනය නිසිපරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2024 වර්ෂයේ සිට ද්‍රව්‍ය ආපසු භාරදීමේ ලේඛනය සකස් කර යාවත්කාලීන කරමින් පවත්වාගෙන යනු ලබයි.
සභාව විසින් වියදම් සීමාවන් තීරණය කර නගරාධිපතිවරයා/සභාපතිවරයා සහ නිලධාරීන් වෙත පැවරීමක් සිදු කර නොතිබුණි.	2025 වර්ෂයේ සිට වියදම් සීමාවන් තීරණය කර ඇත.
සංයුක්ත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙළ කර නොතිබුණි.	2026 වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙළ කර ඇත.
2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 13 ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	2025,2026 වර්ෂ සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 13 ඡේදය ප්‍රකාරව සකස් කර ඇත.
විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 04 ක් වත් පවත්වා නොතිබුණි.	2024 සහ 2025 වර්ෂයන්හි එක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් එක බැගින් පවත්වා ඇති අතර 2026 වර්ෂයෙහි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 04 ක් පැවැත්වීමට කටයුතු කරමි
සියළු වත්කම් වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	ඔප්පු ඇති ඉඩම් සඳහා පවතින ප්‍රතිපාදන මත වත්කම්වල ආරක්ෂාව සඳහා වැට මායිම් සකස් කිරීමට කටයුතු කරනු ලබන අතර ඔප්පු හා පිඹුරුපත් නොමැති ඉඩම් සඳහා වැට මායිම් සකස් කිරීම ගැටළු සහගත බැවින් ඔප්පු හා පිඹුරුපත් ලබා ගැනීමේ කටයුතු මේ වන විට සිදු කරනු ලැබේ.
වාහනයක් ගර්හිත වී මාස 08 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	2025.03.28 දින බැකෝ යන්ත්‍රය වෙන්දේසි කරන ලදී. 2026.02.03 දින මාර්ග තලනය මාතර මහ නගර සභාව වෙත පරිත්‍යාග කරන ලදී.
බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලැපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	බැංකු සැසඳුම් ප්‍රකාශනවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ නිරවුල් කර ඇත.
වර්ෂයට අදාලව බිල් කළ ආදායමෙන් අය කිරීම පහළ මට්ටමක විය.	රතු නිවේදන නිකුත් කරමින් හා ක්ෂේත්‍රයේ ගොස් හිහ මුදල් එකතු කරමින් හිහ වරිපනම් ආදායම් එකතු කිරීමට

සුගත් වෙංගප්පුලි
සභාපති
මාතර ප්‍රාදේශීය සභාව

	කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.
වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් සියලු දේපළ සඳහා එළඹිය යුතු ගිවිසුම් සියල්ල පූර්ණ ලෙස ඉටුකර නොතිබුණි.	වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් සියලු දේපළ සඳහා ගිවිසුම් එළඹී ඇත.
වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් සියලු දේපළ සඳහා අයවිය යුතු සියළු බදු මුදල් පූර්ණ ලෙස අයකර නොතිබුණි.	වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් සියලු දේපළ සඳහා අයවිය යුතු සියළු බදු මුදල් පූර්ණ ලෙස අයකර ගෙන ඇත.

.....

සභාපති

මාතර ප්‍රාදේශීය සභාව

සුගත් වෙංගප්පුලි
සභාපති
මාතර ප්‍රාදේශීය සභාව

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492
ආයතනයේ නම - මාතර ප්‍රාදේශීය සභාව

රජයේ ගිණුම්කාරක සභාව විසින් කාර්යසාධන ඇගයීම ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
දෙවන කොටස : 90.50	
සභාවට අදාළ ප්‍රගාමී තොරතුරු ප්‍රදර්ශනය කර නොතිබුණි.	සභාවට අදාල ප්‍රගාමී තොරතුරු ප්‍රදර්ශනය කර තිබේ.
ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස්කිරීමට වැඩ පිළිවෙළක් නොතිබුණි.	2025 වර්ෂයේ ජගත් පරිසර දිනය නිමිත්තෙන් මාතර ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කර උයන්වත්ත පාපන්දු ක්‍රීඩාංගනය වෙත භාරදෙන ලදී.
මහ නගරසභා ආඥා පනතේ 272 වගන්තිය / නගර සභා අඥා පනතේ 157 වන වගන්තිය/ප්‍රාදේශිය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යාවස්ථා පනවා නොතිබුණි.	අවශ්‍යතාව මත අතුරු ව්‍යාවස්ථා පනවා ගැනීමට කටයුතු කරමි.
අතුරු ව්‍යාවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබු කර්තව්‍යන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.	අවශ්‍යතාවය මත අතුරු ව්‍යාවස්ථා සකස් කිරීමටත්,එසේ සිදුකිරීමකදී, අතුරු ව්‍යාවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබෙන කර්තව්‍යන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමටත් කටයුතු කරනු ලබයි.
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි	සභාවේ බඳවාගැනීම් තුළ අතිරික්ත බඳවා ගැනීම් නැත.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50 %ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2024 වර්ෂයේ සැලැසුම්ගත පුහුණු අවස්ථාවලින් 75% ක මට්ටම දක්වා ලහා වී ඇත.

.....
සභාපති
මාතර ප්‍රාදේශීය සභාව

සුගත් වේංගප්පුලි
සභාපති
මාතර ප්‍රාදේශිය සභාව

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : - 492

ආයතනයේ නම : - කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

රජයේ ගිණුම්කාරක සභාව විසින් කාර්ය සාධන ඇගයීම ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියා මාර්ග
පළමු කොටස 61.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ,යටත්ව මට්ටමේ /ව්‍යාවන මට්ටමේ /අහිතකර මට්ටමේ විය.	2023 ගිණුම සඳහා යටත්ව මට්ටමේ මතයක් ඉදිරිපත්ව ඇත.
වීටී පහන් ලේඛනය යාවත් කාලීන කර පවත්වා ගෙන නොතිබුණි.	වීටී පහන් සමීක්ෂණය අවසන් කර ලේඛනය යාවත්කාලීන කර ඇත.
මාර්ග ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන නොතිබුණි.	මාර්ග මැනුම් කිරීම හා තොරතුරු ලබා ගැනීමේ ක්‍රියාවලිය අවසන් කර මාර්ග ඉන්වෙන්ට්‍රිය සකස් කර ඇත.
ද්‍රව්‍ය ආපසු භාර දීමේ ලේඛනය නිසි පරිදි යාවත් කාලීන කර පවත්වා නොතිබුණි	ආයතනය සෘජු ශ්‍රමය යටතේ කර්මාන්තයන් සිදු නොවන බැවින් මෙම ලේඛනය භාවිතා නොවේ.
ගල් හා බොරලු ලේඛනය නිසි පරිදි යාවත් කාලීන කර පවත්වා නොතිබුණි	ආයතනය සෘජු ශ්‍රමය යටතේ කර්මාන්තයන් සිදු නොවන බැවින් මෙම ලේඛනය භාවිතා නොවේ.
මූල්‍ය හා බල තල පැවරීම ප්‍රමාණවත් පරිදි ආයතනය තුළ සන්නිවේදනය කර නොතිබුණි.	මූල්‍ය බල තල පැවරීමක් සිදු කර නොමැති බැවින් ආයතනය තුළ සන්නිවේදනය කළ නොහැක.
මෘදුකාංගනයට අදාළ මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි.	ඉදිරියේදී මුරපද වෙනස් කිරීමට උපදෙස් ලබා දී ඇත.
සංයුත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි.	ආයතනයේ සියළුම සැපයුම් වෙනුවෙන් පොදු ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර ක්‍රියාත්මක කරනු ලබයි.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම පිළිතුරු සපයා නොතිබුණි.	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන සියළුම විගණන විමසුම් සඳහා පිළි තුරු සපයා ඇත.අවස්ථා සුළු ප්‍රමාණයකදී පමණක් නියමිත දිනයට පිළිතුරු ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	සියළුම අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු සපයා ඇත.අවස්ථා සුළු ප්‍රමාණයකදී පමණක් නියමිත දිනයට පිළිතුරු ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත.
මුදල් රෙගුලාසි ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි.
විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන වැඩ සටහන වර්ෂය ආරම්භයේදී පිළියෙල කර ක්‍රියාත්මක කර ඇති අතර එය විගණකාධිපති විමසා පිළියෙල කිරීම පමණක් සිදු වී නොමැත. එය ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි.

බී. කේ. එස්. එන්. සමරසිංහ
සභාපති
ප්‍රාදේශීය සභාව
කිරින්ද - පුහුල්වැල්ල.

විගණන හා කළමනාකරණ රැස්වීම් වාර 04 ක් වත් පවත්වා නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි.
සියළු වත්කම් වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	සියළුම ඉඩම් වල දැන්වීම් පුවරු යොදා සභාව සතු වත්කමක් බව තහවුරු කර ඇත.ප්‍රතිපාදන ලැබෙන පරිදි සභාව සතු ඉඩම් වල වැට මායිම් සකස් කරමින් පවතී.
සංචික වාහන සඳහා දෛනක ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	සෑම මාසයමකම දෛනික ධාවන සටහන් පත්‍ර හා සාරාංශ වාර්තා විගණකාධිපති වරයා වෙත ඉදිරිපත් කර ඇත.අවස්ථා කිහිපයකදී පමණක් යම් ප්‍රමාදයන් සිදු වී ඇති අතර මේ වන විට එම තත්වය මග හරවා ගෙන ඇත.
බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ සැලසුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වන සියළු ගැලපීම් සිදු කර ඇති අතර එය අවස්ථා කිහිපයකදී පමණක් මාසයක කාලය ඉක්මවා ඇති බව දැනුම් දෙමි.මසක් තුළ නිරවුල් කිරීම මේවන විට ක්‍රියාත්මක වෙමින් පවතී.
වර්ෂයට අදාළව බිල් කළ ආදායමෙන් අය කිරීම පහළ මට්ටමක විය.	වර්ෂයට අදාළ හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කර ඇත.
ටෙන්ඩර් මත වාර්ෂිකව බදු දිය යුතු සභාවේ දේපළ සමාලෝචිත වර්ෂය තුළදී එසේ සම්පූර්ණ ලෙස බදු දී නොතිබුණි.	වාර්ෂිකව බදු දිය යුතු සභාවේ දේපළ ටෙන්ඩර් කිරීමට කටයුතු කලද ටෙන්ඩර් කරුවන් ඉදිරිපත් නොවූ බැවින් සියළු දේපළ බදු දීමට නොහැකි වී ඇත.
වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් දේපළ සඳහා එළඹිය යුතු ගිවිසුම් සියල්ල පූර්ණ ලෙස ඉටු කර නොතිබුණි.	ටෙන්ඩර් කිරීමට කටයුතු කලද ටෙන්ඩර් කරුවන් ඉදිරිපත් නොවූ දේපළ බදු දීම සිදු නොවූ බැවින් ඒවාට අදාළ බදු මුදල් සභාව විසින් සෘජුවම අය කිරීම සිදු කරයි.එවැනි අවස්ථා වලදී ගිවිසුම් ගත වීමක් සිදු වී නැත.
වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් සියළු දේපළ සඳහා අය විය යුතු සියළු බදු මුදල් පූර්ණ ලෙස අය කර ගෙන නොතිබුණි.	2024 වර්ෂයේ සිට නිවැරදි කර ඇත.
හිඟ හිටි බදු කුලී අය කර ගැනීම සම්බන්ධව අදාළ ගිවිසුම් ප්‍රකාරව නෛතික ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.	මේ වන විට නෛතික ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කර ඇත.
දීර්ඝ කාලීනව බදු දුන් දේපළ සියල්ල සඳහා ගිවිසුම් ගත වීම් අවසන් කර නොතිබුණි	2024 වර්ෂයේ සිට නිවැරදි කර ඇත.

බී. කේ. එස්. එන්. සමරසිංහ
සභාපති
ප්‍රාදේශීය සභාව
කිරින්ද - පුහුල්වැල්ල.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය :- 492

ආයතනයේ නම :- කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

රජයේ ගිණුම්කාරක සභාව විසින් කාර්ය සාධන ඇගයීම ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියා මාර්ග
දෙවන කොටස 53 .50	
සභවට අවශ්‍ය ප්‍රගාමී තොරතුරු ප්‍රදර්ශනය කර නොතිබුණි.	ප්‍රගාමී තොරතුරු මේ වන විට ප්‍රදර්ශනය කර ඇත.
ආයතනය පිළිබඳව මහජනයාට තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	මහජනතාවට තොරතුරු ලබා දීම සඳහා වෙබ් අවවියක් නිර්මාණය කර ඇත.
ආයතනයේ පවත්වා ගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාව පැමිණිලි හෝ ප්‍රසංශා සටහන් කිරීම සඳහා අවස්ථාවක් සලසා නොතිබුණි.	ඒ සඳහා අවධානය යොමු කොට ඇත.
හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක නියම කර නොතිබුණි.	ජයග්‍රහණ දර්ශක පිළිබඳ අවධානය යොමු කොට ඇක.
මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය නගර සභා ආඥා පනතේ 157 වගන්තිය/ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුනි.	අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම සිදු කර නොමැති අතර සම්මත පොදු අතුරු ව්‍යවස්ථාව වැළඳ ගැනීම සිදු කර ඇත.
මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධරයකු නම් කර නොතිබුණි.	මේ වන විට මානව සම්පත් සැලැස්ම සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත් කර ඇත.
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවා ගෙන තිබුණි.	අනුමත ප්‍රමාණය ඉක්මවා නිලධාරීන් අනුයුන්ත කිරීම හා අනුමත සැලැස්මේ නොමැති නිලධාරීන් කාර්යාලයට අනුයුක්ත කිරීමෙන් මෙම තත්වය ඇති වී ඇති අතර මේවන විට මෙම තත්වය නිවැරදි කිරීම සඳහා කටයුතු කරමින් පවතී.
2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්ය භාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්ය සාධන දර්ශක 03 ක් හඳුනාගෙන නොතිබුණි.	මේ වන විට ඒ පිළිබඳ අවධානය යොමු කොට ඇක.

බී. කේ. එස්. එන්. සමරසිංහ
සභාපති
ප්‍රාදේශීය සභාව
කිරින්ද - පුහුල්වැල්ල.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම - දික්වැල්ල ප්‍රාදේශීය සභාව

රජයේ ගිණුම්කාරක සභාව විසින් කාර්යසාධන ඇගයීම ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
පලමු කොටස : 72.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ /අහිතකර මට්ටමේ විය.	වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය තත්ත්වාගණනය කළ මතයක් ලෙස ප්‍රකාශ කර ඇත.
මිණුම් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මිණුම් පොත් නිසි පරිදි යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලබයි.
ඉඩම් කට්ටි කර විකිණීමේ බදු ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ඉඩම් කට්ටි කර විකිණීමේ බදු ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලබයි.
ඇස්තමේන්තු ලෙජරය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ඇස්තමේන්තු ලෙජරය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලබයි.
ගල් හා බොරළු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි	ගල් හා බොරළු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලබයි.
සභාව විසින් වියදම් සීමාවන් තීරණය කර නගරාධිපතිවරයා/ සභාපතිවරයා සහ නිලධාරීන් වෙත පැවරීමක් සිදු කර නොතිබුණි.	සභාව විසින් වියදම් සීමාවන් තීරණය කර අදාල තනතුරු වෙත පැවරීම සිදු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.
ප්‍රධාන සංයුත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	2023-2026 සිව් අවුරුදු සැලැස්ම පිළියෙල කර ඇත.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම පිළිතුරු සපයා නොතිබුණි.	සෑම විගණන විමසුමක් සඳහාම අදාළ වර්ෂය තුලම පිළිතුරු සපයා ඇත.

රුවන් වික්‍රමආරච්චි
සභාපති
ප්‍රාදේශීය සභාව
දික්වැල්ල

මු.රෙ.ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	සෑම වසරකම අවසන් ගිණුම් සකස් කිරීමේදී අභ්‍යන්තර විගණන වාර්තාවලට අදාල තොරතුරු අදාල ආකෘති ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 4ක් වත් පවත්වා නොතිබුණි.	2023 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03ක් ද ,2024 හා 2025 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 01 බැගින් ද පවත්වා ඇත.
සියළු වත්කම්වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	සභාව සතු සියලු වත්කම් වලින් 90% ක ආරක්ෂාව තහවුරු කර ගෙන ඇති අතර අනෙකුත් වත්කම් වල ද ආරක්ෂාව තහවුරු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	සභාව සතු සියළු වාහන වල අයිතිය තහවුරු කර ගෙන ඇත.
වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	අපහරණය කර නොතිබූ වීටී පහන් රථය හා එක්ස්කැවේටර් යන්ත්‍රය 2024.06.13 දින අපහරණය කර වෘත්තීය පුහුණු අධිකාරිය පලපොත වෙත භාර දී ඇත.
සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	සභාව සතු සියලු වාහන සඳහා රාජ්‍ය ලාංඡනය යොදා ඇත.
වර්ෂයට අදාලව බිල් කළ ආදායමෙන් අය කිරීම පහළ මට්ටමක විය.	සමාලෝචිත වර්ෂයේ වරිපනම් සඳහා බිල් කළ ආදායම වන රු. 7,302,572.92 න් රු. 4,659,746.44 ක් සමාලෝචිත වර්ෂයේ පළමු කාර්තුව තුළදීම අය කර ගෙන ඇති අතර එය 63.81% ක ප්‍රතිශතයකි. කඩකුලි/ කඩ අල්ලි සඳහා බිල් කළ ආදායම වන රු. 1,541,338.00 න් රු. 1,336,588.00 මුදලක් සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් මාසය වනවිට අය කර ගෙන ඇති අතර එය 86.71%ක ප්‍රතිශතයකි.
හිහහිටි බදු කුලී අයකර ගැනීම සම්බන්ධව අදාළ ගිවිසුම් ප්‍රකාරව නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	එසේ අයකර ගැනීමට හිහහිටි බදු කුලී නොමැත.
ව්‍යාපාර බලපත්‍ර ලබා නොගත් ආයතන සඳහා නඩු පැවරීමක් සිදු කර නොතිබුණි.	සියලුම ව්‍යාපාර ආයතන සඳහා බදු අය කර ඇති බැවින් නඩු පැවරීමක් සිදු කර නොමැත.

රුවන් වික්‍රමආරච්චි
සභාපති
ප්‍රාදේශීය සභාව
දික්වැල්ල

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම - දික්වැල්ල ප්‍රාදේශීය සභාව

රජයේ ගිණුම්කාරක සභාව විසින් කාර්යසාධන ඇගයීම ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
දෙවැනි කොටස : 54.50	
සභාවට අදාළ ප්‍රගාමී තොරතුරු ප්‍රදර්ශනය කර නොතිබුණි.	සභාවට අදාළ ප්‍රගාමී තොරතුරු දැන්වීම් පුවරුවෙහි ප්‍රදර්ශනය කරනු ලබයි.
හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක නියම කර නොතිබුණි.	හඳුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක 2022 වර්ෂයේ සිට තීරණය කර ක්‍රියාත්මක කර ඇත.
ප්ලාස්ටික් සහ පොලිතින් ප්‍රතිවක්‍රීකරණය සඳහා යොමු කිරීමේ සංවිධානාත්මක වැඩපිළිවෙලක් නොතිබුණි.	සභාව සතුව බෙල් යන්ත්‍ර දෙකක් ඇති අතර බල ප්‍රදේශයේ නොදිරන කසළ විධිමත් ලෙස එකතු කර බෙල් කිරීම සිදු කරනු ලබයි. කසළ අංගනයක් ඉදි කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකසා ඇති අතර මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර නිර්දේශය සඳහා යොමු කර ඇත.
පළාත් පාලන ආයතනයෙන් පරිසර බලපත්‍ර ලබා ගතයුතු සියලු ආයතන පරිසර බලපත්‍ර ලබා ගෙන නොතිබුණි.	හඳුනා ගත් සියළු ආයතන සඳහා පවතින ගැටළු නිරාකරණය කර ගනිමින් බලපත්‍ර ලබා දීමේ කටයුතු සිදු කරමින් පවතී.මේ වනවිට ආයතන 135 ක් සඳහා බලපත්‍ර නිකුත් කර ඇත.
මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය/නගර සභා ආඥා පනතේ 157 වගන්තිය/ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.	අතුරු ව්‍යවස්ථා සම්පාදනයට සම්පත් දායකයකුගේ සහාය ලබා ගැනීමට නොහැකි වීම මේ සඳහා හේතු වී ඇති බැවින් කඩිනමින් අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග සිදු කරනු ලබයි.
ආයතනයේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයීමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය අධීක්ෂණයට කමිටුවක් පත් කර ඇත. ඉදිරියේදී විධිමත්ව එකී කමිටුව හරහා අදාල කාර්යය සිදු කරනු ලබයි.

රුවන් වික්‍රමආරච්චි
සභාපති
ප්‍රාදේශීය සභාව
දික්වැල්ල

සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී නිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	සැලසුම් ගත පුහුණු අවස්ථාවලින් ලබා දෙනු ලබන පුහුණු අවස්ථා ප්‍රමාණය 75% ට වඩා වැඩි කිරීමට කටයුතු කර ඇත.
2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක 03ක් හඳුනාගෙන නොතිබුණි.	ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක 04 ක් මේ වනවිට හඳුනාගෙන ඇති අතර ඊට අදාලව වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී.

රුවන් වික්‍රමආරච්චි
සභාපති
ප්‍රාදේශීය සභාව
දික්වැල්ල

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492
ආයතනයේ නම - දෙවිනුවර ප්‍රාදේශිය සභාව

රජයේ ගිණුම්කාරක සභාව විසින් කාර්යසාධන ඇගයීම ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
පළමු කොටස : 74.00	
ආයතනයේ ගිණුම පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/අභිතකර මට්ටමේ විය.	වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය තත්ත්වාගණනය කළ මතයක් ලෙස ප්‍රකාශ කර ඇත.
හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර ඇත.
මිනුම් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මිනුම්පත්‍ර පරිගණක ආශ්‍රිතව සකස් කරන බැවින් එහි දෘඩ පිටපත් මුද්‍රණය කර ගොනු කරන අතර මිනුම් පොතක් භාවිතා නොකරයි.
මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	සභාවට අයත් ග්‍රාම නිලධාරී වසම් 12 ට අදාළ මාර්ග මැනුම් කර අවසන් කර ඇති අතර, නව මාර්ග සිතියමට හා මාර්ග ඉන්වෙන්ට්‍රියට ඇතුළත් කිරීමට කටයුතු සිදු කර ගැසට් කිරීම සඳහා යොමු කරනු ලබයි.
ඇස්තමේන්තු ලෙජරය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ඇස්තමේන්තු පරිගණක ආශ්‍රිතව සකස් කරන බැවින් එහි දෘඩ පිටපත් මුද්‍රණය කර ගොනු කරන අතර ඇස්තමේන්තු ලෙජරය භාවිතා නොකරයි.
ගල් හා බොරලු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ගල් හා බොරලු ලේඛනය සකස් කර මේ වන විට යාවත්කාලීන කරමින් පවත්වාගෙන යනු ලබයි.
සභාව විසින් වියදම් සීමාවන් තීරණය කර නගරාධිපතිවරයා/ සභාපතිවරයා සහ නිලධාරීන් වෙත පැවරීමක් සිදු කර නොතිබුණි.	2026.01.20 දිනැති සභා රැස්වීම් වාර්තාවේ (ඇ) 6. සභා තීරණය අනුව නිලධාරීන් වෙත වියදම් සීමාවන් තීරණය කර පැවරීමක් සිදු කර ඇත.
මූල්‍ය බලතල පැවරීම ප්‍රමාණවත් පරිදි ආයතනය තුළ සන්නිවේදනය කර නොතිබුණි.	මූල්‍ය බලතල පැවරීම ප්‍රමාණවත් පරිදි ආයතනය තුළ සන්නිවේදනය කර ඇත
මාසිකව වැටුප් ලේඛන සහ පාලන ගිණුම් තුලනය කර සහ අදාළ සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි.	2026 වර්ෂයේ මාසික වැටුප් ලේඛන සහ පාලන ගිණුම් තුලනය කර සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර ඇත.
ප්‍රධාන සංයුත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	2024-2028 දක්වා සංයුත සැලැස්ම පිළියෙළ කර ඇත.

එල්. එච්. රෝහිත සිරිලාල් (සූවස්මී)
(විශ්‍රාමික ස්කොඩ්‍රන් ලීඩර්)
සභාපති
ප්‍රාදේශීය සභාව
දෙවිනුවර

දෙවිනුවර පී. රණසිංහ
ලේකම්
ප්‍රාදේශීය සභාව
දෙවිනුවර

සංයුක්ත සැලැස්මට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කොට සභා සම්මත කර නොතිබුණි.	සංයුක්ත සැලැස්මට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කොට සභා සම්මත කර ඇත.
සංයුත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	සංයුත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර ඇත.
විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 4 ක් වත් පවත්වා නොතිබුණි.	2023 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 4 ක් පවත්වා ඇත. 2024 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොමැත. 2025 වර්ෂයේ සිව්වන කාර්තුවේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පවත්වා ඇත. 2026 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.
සියළු වත්කම් වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	සභාව සතු සියලු වත්කම් වලින් 90% ක ආරක්ෂාව තහවුරු කර ඇති අතර අනෙකුත් වත්කම් වල ආරක්ෂාව තහවුරු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. (ආයතන අයිතිය දැන්වූ නාමපුවරු ඇතුළුවීම තහනම් දැන්වීම් පුවරු, ආරක්ෂිත කම්බි වැට යෙදීම...)
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	ආයතනය සතු වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා නිවැරදිව විගණකාධිපති වෙත ඉදිරිපත් කරයි.
සියළු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	ආයතනය සතු සියළු වාහන වල රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කර අලවා ඇති අතර රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	2025 සමාලෝචිත වර්ෂය අවසන් වන විට නිරවුල් කර ඇත.
වර්ෂයට අදාළව බිල් කළ ආදායමෙන් අය කිරීම පහළ මට්ටමක විය.	සමාලෝචිත වර්ෂයේ වරිපනම් සඳහා රු. 352140.75 ක් සහ කඩකුලී සඳහා රු. 1432427.00 ක මුදලක් පළමු කාර්තුව තුළදී අයකරගෙන ඇති අතර හිඟ ආදායම් අය කර ගැනීමට මේ වන විට පහත ක්‍රියාමාර්ග ගෙන ඇත. • ආදායම් පරීක්ෂකවරුන් හරහා හිඟ ආදායම් එකතු කිරීමට කටයුතු කිරීම. • ගෙයින් ගෙට ගොස් වරිපනම් අය කිරීම. • වරිපනම්/ කඩකුලී නොගෙවූ අය වෙත සිහිකැඳවීම් ලිපි යොමු කිරීම.

එල්. එච්. රෝහිත සිරිලාල් (සූසිප)
(විශ්‍රාමික ස්කොඩ්‍රන් ලීඩර්)
සභාපති
ප්‍රාදේශීය සභාව
දෙවිනුවර

දේවිකා පී. රණසිංහ
සභික
ප්‍රාදේශීය සභාව
දෙවිනුවර

ටෙන්ඩර් මත වාර්ෂිකව බදු දිය යුතු සභාවේ දේපළ සමාලෝචිත වර්ෂය තුලදී එසේ සම්පූර්ණ ලෙස බදු දී නොනිබුණි.	ඉඩම් 19 ක් ඵලදා බදු ලබාදීම සඳහා පවතී. ඉන් ඉඩම් 5 ක් බදු දී ඇති අතර අනෙකුත් ඉඩම් බදු දීම සම්බන්ධයෙන් විවිධ ගැටළු පැන නැගී ඇත.

දේවිකා පී. රණසිංහ
ලේකම්
ප්‍රාදේශීය සභාව
දෙවිනුවර

මහ. එච්. රෝහිත සිරිලාල් (යූඑස්පී)
(විශ්‍රාමික ස්කොඩ්‍රන් ලීඩර්)
සභාපති
ප්‍රාදේශීය සභාව
දෙවිනුවර

රජයේ ගිණුම්කාරක සභාව විසින් කාර්යසාධන ඇගයීම ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
දෙවැනි කොටස : 56.50	
සභාවට අදාළ ප්‍රගාමී තොරතුරු ප්‍රදර්ශනය කර නොතිබුණි.	සභාවට අදාළ ප්‍රගාමී තොරතුරු ප්‍රදර්ශනය කර ඇත.
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	මේ වන විට ආයතනය සතුව වෙබ් අඩවියක් නොමැති අතර වෙබ් අඩවියක් නිර්මාණය කිරීමෙන් අනතුරුව මහජන පැමිණිලි හා ප්‍රශංසා යොමු කිරීමට අවස්ථාව සලසා දීමට කටයුතු කරනු ලැබේ.
ජාතික ප්‍රතිපත්ති වලට අනුකූලව කසළ කළමනාකරණ සැලැස්මක් සකස් කර නොතිබුණි.	සභාවේ වරිපනම් සීමාව තුළ දිනපතා කසළ එකතු කිරීම සඳහා කසළ කළමනාකරණ සැලැස්මක් සකස් කර ඇත.
ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩ පිළිවෙලක් නොතිබුණි.	මධ්‍යම පරිසර අධිකාරිය සමඟ එක්ව වාර්ෂිකව ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබේ.
කසළ අපහරණය කිරීම/ කසල කළමනාකරණය කිරීම සඳහා සභාව විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.	කසළ කළමනාකරණ වැඩසටහන යටතේ බැහැර කරනු ලබන කසළ වෙන් කර ලබා දීමට ප්‍රජාව දැනුවත් කර වර්ගීකරණය කර ලබාගැනීමට කටයුතු කර ඇත.
මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය / නගර සභා ආඥා පනතේ 157 වගන්තිය / ප්‍රාදේශිය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.	අතුරු ව්‍යවස්ථා සම්පාදනය සඳහා සම්පත් දායකයෙකුගේ සහාය ලබාගැනීමට නොහැකි වීම මේ සඳහා හේතු වී ඇති අතර කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග සිදු කරනු ලබයි.
පළාත් පාලන ආයතන විසින් අතුරු ව්‍යවස්ථා පනවාගෙන නොමැත්තේ නම් සම්මත අතුරු ව්‍යවස්ථා සභාව විසින් සභා සම්මතයක් මගින් පිළිගෙන, ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර එය වැළඳගෙන නොතිබුණි.	අතුරු ව්‍යවස්ථා සම්පාදනය කිරීමෙන් අනතුරුව සභා සම්මත කරගෙන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර වැළඳගැනීමට කටයුතු සිදු කරනු ලැබේ.
අතුරු ව්‍යවස්ථා පරිශීලනය කිරීම සඳහා මහජනතාවට ප්‍රවේශයක් සලසා දී නොතිබුණි.	වෙබ් අඩවියක් නිර්මාණය කිරීමෙන් අනතුරුව අතුරු ව්‍යවස්ථා පරිශීලනය කිරීම සඳහා මහජනතාවට ප්‍රවේශයක් ලබා දීමට කටයුතු සිදුකරනු ලබයි.

දෙදයා.පී. රණසිංහ
ලේකම්
ප්‍රාදේශිය සභාව
දෙවිනුවර

අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	සේවයේ අවශ්‍යතාවය මත සේවක බඳවාගැනීම් සිදුකර ඇති අතර එම සේවක මහත්ම මහත්මීන් වෙත රාජකාරී පැවරීම් සිදු කර ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2026 වර්ෂයේ පුහුණු සැලැස්මට අනුව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදුකර ඇත.
2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් වක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධන දර්ශක 03 ක් හඳුනාගෙන නොතිබුණි.	ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධන දර්ශක හඳුනාගැනීමට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී.

එම්. එච්. රෝහිත ඩිවිලාල් (මූලාසන)
(විශ්‍රාමික ස්කොවුන් ලිඩර්)
සභාපති
ප්‍රාදේශීය සභාව
පදවිහුවර

ආයතනයේ නම - වැලිගම ප්‍රාදේශීය සභාව

රජයේ ගිණුම්කාරක සභාව විසින් කාර්යසාධන ඇගයීම් ප්‍රාකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
පළමු කොටස : 73.00	
සභා නිරණ ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2026/05/31 දිනට යාවත්කාලීන කර ඇත.
මිනුම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	සෘජු ග්‍රම පදනමට කර්මාන්ත සිදු නොයන බැවින් ලේඛණයක් පවත්වා නොගනී.
මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	සකස් කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත.
ඇස්තමෙනතු ලෙජරය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	පවත්වා නොගනී.
ද්‍රව්‍ය ආපසු භාරදීමේ ලේඛණය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ඉදිරියේදී පවත්වා ගෙන යාමට කටයුතු කරන බව දන්වමි.
ගල් හා බොරළු ලේඛණය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	සෘජු ග්‍රම පදනමට කර්මාන්ත සිදු නොයන බැවින් ලේඛණයක් පවත්වා නොගනී.
සභාව විසින් වියදම් සීමාවන් නිර්ණය කර නගරාධිපතිවරයා/සභාපතිවරයා සහ නිලධාරීන් වෙත පැවරීමක් සිදුකර නොතිබිණි.	ඉදිරියේදී සීමාවන් පැවරීමට කටයුතු කරන බව දන්වමි.
මූල්‍ය බලතල පැවරීම ප්‍රමාණවත් පරිදි ආයතනය තුළ සන්නිවේදනය කර නොතිබිණි.	ඉදිරියේදී මූල්‍ය බලතල පැවරීම සන්නිවේදනය කිරීමට කටයුතු කරන බව දන්වමි.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම පිළිතුරු සපයා නොතිබුණි.	2026/06/02 දින වන විට සියළුම විගණන විමසුම් සඳහා පිළිතුරු විගණකාධිපති වෙත යොමු කර ඇත.
මූ.රෙ. ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරියේදී අභයන්තර විගණන වාර්තාවල පිටපත් විගණනයට යොමු කිරීමට කටයුතු කරන බව දන්වමි.
විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 04 ක් වත් පවත්වා නොතිබුණි.	2026 වර්ෂය තුළ රැස්වීම් පැවැත්වීමට කටයුතු කරන බව දන්වමි.
සියළු වත්කම්වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	වත්කම් වල අයිතිය තහවුරු කර ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කරන බව දන්වමි.
වාර්ෂික භාණ්ඩ සම්ක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත/ඌණතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව දන්වමි.
වාහනයක් ගර්හිත වී මාස 08 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	වාහනයක් ගර්හිත වූ විට ලියාපදිංචිය අවලංගු කළ යුතු නිසා දැනට ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි.
	ඉදිරියේදී වාහනවල රාජ්‍ය ලාංඡනය

නීතිඥ චින්තක හේවාපතිරණ
සභාපති
වැලිගම ප්‍රාදේශීය සභාව

<table>
<tr><td>සියළු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.</td><td>පින්තාරු කිරීමට කටයුතු කරන බව දන්වමි.</td></tr>
<tr><td>වර්ෂයට අදාලව බිල් කළ ආදායමෙන් අය කිරීම පහළ මට්ටමක විය</td><td>2025/12/31 ට පැවති හිඟයෙන් 2026/06/02 දිනට අයවීම් පහත පරිදි වේ.

<table><tr><td>ආදායම් ප්‍රභවය</td><td>26/06/02 දිනට හිඟයෙන් අයවීම්</td></tr><tr><td>කඩකුලි</td><td>13.11%</td></tr><tr><td>දැන්වීම් පුවරු</td><td>100 %</td></tr><tr><td>වෙනත් බදු</td><td>23.65%</td></tr><tr><td>ව්‍යාපාර බදු</td><td>11%</td></tr><tr><td>වෙළෙඳ බලපත්‍ර</td><td>16%</td></tr><tr><td>1% බලපත්‍ර</td><td>100%</td></tr><tr><td>වරිපනම්</td><td>36.32%</td></tr></table></td></tr>
<tr><td>හිඟ හිටි බදු කුලි අයකර ගැනීම සම්බන්ධව අදාල ගිවිසුම් ප්‍රකාරව නෛතික ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.</td><td>දීර්ඝ කාලීනව හිඟ පැවති ශේෂ සඳහා නඩු පවරා ඇත.</td></tr>
<tr><td>දෙවැනි කොටස : 45.00</td><td></td></tr>
<tr><td>ආයතනය පිළිබඳ මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.</td><td>දැනට වෙබ් අඩවිය නිර්මාණය කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය පිරිවිතර සකස් කරමින් පවතින බව දන්වමි.</td></tr>
<tr><td>ආයතනයේ පවත්වා ගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සළසා දී නොතිබුණි.</td><td>නව වෙබ අඩවිය සංවර්ධනය කිරීමෙන් අනතුරුව එම පහසුකම් සලසාදීමට අපේක්ෂිත බව දන්වමි.</td></tr>
<tr><td>හදුනා ගත් තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක තීරණය කර නොතිබුණි.</td><td>ඉදිරියේදී තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි.</td></tr>
<tr><td>ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩ පිළිවෙලක් නොතිබුණි.</td><td>2026 වර්ෂය තුළ ඒ සඳහා අවශ්‍ය වැඩපිළිවෙලක් සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි.</td></tr>
<tr><td>ප්ලාස්ටික් හා පොලිතීන් ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කිරීමේ සංවිධානාත්මක වැඩපිළිවෙලක් නොතිබුණි.</td><td>දැනට ඒ සඳහා වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වෙමින් පවතී.</td></tr>
<tr><td>පළාත් පාලන ආයතනයෙන් පරිසර බලපත්‍ර ලබා ගත යුතු සියළු ආයතන පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි.</td><td>කර්මාන්ත හිමිකරුවන්ට ලිඛිතව දැනුවත් කර ඇති බව දන්වමි.</td></tr>
<tr><td>මහ නගර සභා ආඥා පනතේ 272 වගන්තියේ නගර සභා ආඥා පනතේ 157 වගන්තියේ ප්‍රාදේශිය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.</td><td>පළාත් සභාව මගින් පනවන ලද අතුරු ව්‍යවස්ථා වැළදගෙන ඇති බව දන්වමි.</td></tr>
<tr><td>ආයතනයේ පූරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිලිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.</td><td>දැනට ඒ සඳහා වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වෙමින් පවතී.</td></tr>
<tr><td>අනුමත සිමාව ඉක්මවා කාර්යය මණ්ඩල</td><td>ප්‍රා.ලේ කොට්ඨාශ 02 කට අදාල විශාල බල</td></tr>
</table>

නීතිඥ චින්තක හේවාපතිරණ
සභාපති
වැලිගම ප්‍රාදේශීය සභාව

බදවාගෙන නොතිබුණි.	ප්‍රදේශයක් වන බැවින් රාජකාරී බහුල නිසා අනුමැත කාර්ය මණ්ඩලය වැඩි කර ගැනීම සඳහා මේ වන විට නිසි නිල මගින් යොමු කර ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවශ්‍යතා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2026 වර්ෂය තුළ නව පුහුණු වැඩපිළිවෙලක් සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි.
රජයේ ගිණුම් කාරක සභා නියෝග හෝ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	දැනට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දනිවමි.
පළාත් ගිණුම් කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක නර නොතිබුණි.	දැනට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දනිවමි.
2020.08.26 දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රාකාරව ආයතනය විසින් ඉටුකළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිනුම් කළ හැකි කාර්ය සාධන දර්ශක 03 ක් හඳුනාගෙන නොතිබුණි.	ඉදිරියේදී කාර්යසාධන දර්ශක හඳුනා ගැනීමට කටයුතු කරන බව දන්වමි.

නීතිඥ චින්තක හේවාපතිරණ
සභාපති
වැලිගම ප්‍රාදේශීය සභාව

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය :- 492

ආයතනයේ නම :- හක්මණ ප්‍රාදේශීය සභාව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු රජයේ ගිනුම්කාරක සභාව විසින් කාර්යසාධන ඇගයීම් ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
පළමු කොටස	79.00
ආයතනයේ ගිණුම් පිළිබඳව විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ /අහිතකර මට්ටමේ විය.	2025 වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය තත්ත්වාගණනය කළ මතයකි.
ගල් හා බොරළු ලේඛණය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවතින පස් හා බොරළු මාර්ග සංවර්ධනය කිරීමේ දී සෘජු ශ්‍රමික සංවර්ධන ව්‍යාපෘති සිදු නොකරන බැවින් ගල් හා බොරළු ලේඛණයක් නඩත්තු කොට පවත්වාගෙන යාමට අවශ්‍ය නොවන අතර එවැනි ව්‍යාපෘති කොන්ත්‍රාත් පිරිනැමීමට කටයුතු කරනු ලැබේ.
සභාව විසින් වියදම් සීමාවන් තීරණය කර සභාපතිවරයා සහ නිලධාරීන් වෙත පැවරීමක් සිදු කර නොතිබුණි.	ප්‍රාදේශීය සභාවේ වාර්ෂික අයවැය ලේඛණය අනුව වැය විෂයන් සඳහා සීමා ඇතත් සභාපතිවරයාගේ හා නිලධාරීන්ගේ වියදම් සඳහා සීමා තීරණය කර නොමැත.
මාසිකව වැටුප් ලේඛණ සහ පාලන ගිණුම් තුලනය කර සහ අදාළ සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර නොතිබුණි.	ප්‍රාදේශීය සභාව සඳහා මාසික වැටුප් ලේඛණය හෝ පාලන ගිණුම තුලනය කිරීමක් හෝ සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමක් සිදු නොකරයි.
මෘදුකාංගයට අදාළ මුරපද තුන් මසකට වරක් වෙනස් කර නොතිබුණි.	මෘදුකාංගවල මුරපද වෙනස් කිරීම සඳහා අදාළ මාදුකාංග නිමැයුම්කරු සිදු කළ යුතු අතර මෘදුකාංග භාවිතා කරනු ලබන පරිගණක සඳහා අනන්‍ය වූ මුරපද භාවිතා කරමින් ආරක්ෂිත පියවර අනුගමනය කර ඇත.
සංයුක්ත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙළ කර නොතිබුණි.	මෙම ප්‍රාදේශීය සභාවට අදාළව සිවු අවුරුදු සැලැස්මක් සහ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරනු ලබන අතර සංයුක්ත සැලැසුමක් සකස් කරනු නොලැබේ.නමුත් ප්‍රසම්පාදන සැලැස්මක් වාර්ෂිකව සකස් කිරීම සිදු කරනු ලබයි.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	මෙම ප්‍රාදේශීය සභාවට අදාළව වර්තමානය වන විට අවශ්‍ය අභ්‍යන්තර විගණන විමසුම් සඳහා නියමිත දිනට නියමිත පරිදි පිළිතුරු ලබා දීම සිදු වේ.
මු.රෙ. ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2023 වර්ෂය වන විට අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම සිදු නොවූ අතර වර්තමානයේ දී නිසි පරිදි එම වාර්තා යැවීම සිදු කරයි.
විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 4ක් වත් පවත්වා නොතිබුණි.	වර්තමානය වන විට නිසි පරිදි රැස්වීම් පැවැත්වේ.
සියලු වත්කම්වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	වර්තමානය වන විට ප්‍රාදේශීය සභාව සතු පොදු ළිං හැර අනෙකුත් සියලු වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කර ඇත.
වාහනයක් ගර්හිත වී මාස 08 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	ලියාපදිංචි අංක 49-0271 දරන මහ ට්‍රැක්ටරය ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක අමාත්‍යාංශයට අයිත් වුවක් වන අතර හක්මන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් මෙම ප්‍රාදේශීය සභාවට ලබා දී ඇත.එම ට්‍රැක්ටරයේ චැසි අංකය හා එංජින් අංකය අතර පරස්පරතාවයක් ඇති බැවින් එය ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම සඳහා ගැටලු සහගත තත්වයක් උද්ගත වී ඇත.තවද මෙම රථය ක්‍රියා විරහිත තත්වයේ පවතින එකකි.
සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	සභාව සතු සියලුම වාහනවල මේ වන විට රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීම සිදු කර ඇත.

ආර්.එම්.ඩබ්ලිව්. සෙනෙවිරත්න
සභාපති
හක්මණ ප්‍රාදේශීය සභාව

වර්ෂයට අදාළව බිල්කල ආදායමෙන් අය කිරීම පහළ මට්ටමක විය.	2025.12.31 දින වන විට වරිපනම බිල් කිරීම් වලින් 79% ක් අය කරගෙන ඇති අතර හිඟ බිල්පත් අය කර ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.
දිර්ඝ කාලීනව බදු දුන් දේපළ සියල්ල සඳහා ගිවිසුම්ගත වී කටයුතු අවසන් කර නොතිබුණි.	2025 වර්ෂය අවසාන වන විට දිර්ඝ කාලීනව බදු දුන් දේපල සියල්ල සඳහා ගිවිසුම්ගත වීමට අවශ්‍ය කටයුතු අවසන් කර ඇත.
දිර්ඝ කාලීනව බදු දුන් දේපල වලින් වාර්ෂිකව අය කල යුතු බදු කුලී අයකරගෙන නොතිබුණු අවස්ථා විය.	2025 වර්ෂය අවසාන වන විට දිර්ඝ කාලීනව බදු දුන් දේපල වලින් වාර්ෂිකව අය කල යුතු බදු කුලී අය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

ආර්.එම්.ඩබ්ලිව්. සේනෙවිරත්න
සභාපති
හක්මණ ප්‍රාදේශීය සභාව

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය :- 492

ආයතනයේ නම :- හක්මණ ප්‍රාදේශීය සභාව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු රජයේ ගිනුම්කාරක සභාව විසින් කාර්යසාධන ඇගයීම් ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
දෙවන කොටස	50.50
සභාවට අදාළ ප්‍රගාමී තොරතුරු ප්‍රදර්ශනය කර නොතිබුණි.	වර්තමානය වන විට ප්‍රාදේශීය සභාවට අදාළ තොරතුරු ප්‍රදර්ශනය කිරීම සිදු කෙරේ.
හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක නියම කර නොතිබුණි.	2024 වසරේ සිට ජයග්‍රහණ දර්ශක සකස් කර ඇත.
ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩ පිළිවෙලක් නොතිබුණි.	ප්‍රාදේශීය සභාව මගින් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය රැස් කිරීම සිදු කරන අතර එම ද්‍රව්‍ය මධ්‍යම පරිසර අධිකාරියට ලබා දීම සිදු කරයි. එම අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය සඳහා වඩාත් දියුණු තාක්ෂණික විධික්‍රම අවශ්‍ය වන බැවින් ඒවා ලබා ගැනීම අපේක්ෂාව වේ.
වරිපනම් කලාපය ඇතුලත ව්‍යාපාරික ස්ථාන වලින් හා ආයතන වලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අය කර නොතිබුණි.	ප්‍රාදේශීය සභාවේ වරිපනම් කලාපය ඇතුළත ව්‍යාපාරික ස්ථාන වලින් හා ආයතන වලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අය කිරීම සඳහා වැඩ පිළිවෙළක් වර්තමානය වන විට ද සකස් කර නොමැත.
මහ නගර සභා ආඥාපනතේ 272 වගන්තිය / නගර සභා ආඥාපනතේ 157 වගන්තිය /ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.	ප්‍රාදේශීය සභාවට අදාළ වන සේ ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව හක්මණ පොදු මහජන ක්‍රීඩාංගණය හා නාගර ශාලාවට අදාළව කටයුතු කර ඇත.
අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකල යුතුව තිබුණ කර්තව්‍යන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.	ප්‍රාදේශීය සභාවට අදාළව 2026 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත.
ආයතනයේ පුරවැසි හෝ සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	2024 වර්ෂයේ සිට ප්‍රාදේශීය සභාවේ පුරවැසි ප්‍රඥප්තිය ප්‍රදර්ශනය කිරීම සහ ඒ අනුව කටයුතු කිරීම සිදු කරනු ලබයි.
සැලසුම් ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	ප්‍රාදේශීය සභාවට අදාළව 2025 වර්ෂයේ සිට පුහුණු අවස්ථා ප්‍රමාණය 50% වඩා වැඩි මට්ටමකට ළඟා කරගෙන ඇත.
2020.08.28 දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටුකල යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කල හැකි කාර්ය සාධන දර්ශක 03ක් හඳුනාගෙන නොතිබුණි.	ප්‍රාදේශීය සභාවට අදාළව 2025 වර්ෂයේ සිට ඉටුකල යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කල හැකි කාර්ය සාධන දර්ශක ක්‍රියාත්මක වීම සිදු වේ.

ආර්.එම්.ඩබ්ලිව්. සෙනෙවිරත්න
සභාපති
හක්මණ ප්‍රාදේශීය සභාව

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම - කොටපොල ප්‍රාදේශීය සභාව

රජයේ ගිණුම්කාරක සභාව විසින් කාර්යසාධන ඇගයීම ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
පළමු කොටස - 70.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ අහිතකර මට්ටමේ විය.	2023 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය තත්ත්වාගණනය කළ මතයක් ලෙස දක්වා ඇත.
කොන්ත්‍රාත් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2024 වර්ෂයේ සිට කොන්ත්‍රාත් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලැබේ.
මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ග්‍රාම නිලධාරී වසම් 37න් වසම් 24ක මැනුම් කටයුතු අවසන් කර ඇති අතර නිලධාරී හිඟය හේතුවෙන් සහ ඔවුන්ගේ වැඩ ධාරිතාවය වැඩි නිසා ඉතිරි වසම්වල මැනුම් කටයුතු සිදු කිරීමට ප්‍රමාද වී ඇත.
සභාව විසින් වියදම් සීමාවන් නිරණය කර නගරාධිපතිවරයා/සභාපතිවරයා සහ නිලධාරීන් වෙත පැවරීමක් සිදු කර නොතිබුණි.	2024 වර්ෂයේ සිට වියදම් සීමාවන් නිරණය කර පවත්වාගෙන යනු ලැබේ.
මාසික වැටුප් ලේඛන සහ පාලන ගිණුම් තුලනය කර සහ අදාළ සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි.	Payroll මෘදුකාංගය භාවිතයෙන් වැටුප් සකසන අතර වැටුප් පාලන ගිණුමක් සැකසීම 2025 වර්ෂයේ සිට සිදු කරනු ලැබේ.
මෘදුකාංගයට අදාළ මුරපද තුන්මසකට වරක් වෙනස්කර නොතිබුණි.	2026 වර්ෂයේ සිට මුරපද වෙනස් කිරීම සිදු කරනු ලැබේ.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දී ඇත.
විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් වාර 4ක් වත් පවත්වා නොතිබුණි.	2023 වර්ෂයේ විගණන කළමනාකරණ කමිටු 3ක් පවත්වා ඇත.
සියලු වත්කම්වල ආරක්ෂාව තහවුරු කරගෙන නොතිබුණි.	වැටමායිම් යොදා බොහෝ වත්කම් ආරක්ෂා කර ඇති අතර ආයතනයේ ඇති මූල්‍ය තත්ත්වය අනුව අනෙකුත් වත්කම්වල වැටමායිම් සකස් කිරීම සිදු කරනු ලැබේ.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	කාලයක සිට පවතින ඌණතා පිළිබඳ නිර්දේශය සඳහා කමිටුව මඟින් කටයුතු සිදු කර පවතින අතර 2024 වර්ෂයේ සිට අනාවරණය වී ඇති නිර්දේශයන් සිදු කර ඇත.

ජේ.එල්.බී. වම්මි ප්‍රභා
ලේකම්,
කොටපොල ප්‍රාදේශීය සභාව,
දෙනියාය

චමින්ද ගුණසේකර
සභාපති,
කොටපොල ප්‍රාදේශීය සභාව,
දෙනියාය.

රජයේ ගිණුම්කාරක සභාව විසින් කාර්යසාධන ඇගයීම ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	2022.04.08 වන දින සිදු වූ අනතුර සම්බන්ධයෙන් මු.රෙ. (103) I අලාභ හානි පිළිබඳව කටයුතු නිසි පරිදි සිදු කර අදාළ වන්දි මුදල වන රු. 169,900.00ක මුදල ශ්‍රී ලංකා රක්ෂණ සමාගම වෙතින් ලබා ගෙන හානිය පූර්ණය කර ගෙන ඇති අතර අදාල අලුත්වැඩියාව වන්ද්‍රකුමාර මෝටර්ස් වෙතින් සිදු කර ඇත.
වර්ෂයට අදාලව බිල් කළ ආදායමෙන් අය කිරීම් පහළ මට්ටමක විය.	2023 වර්ෂයේ බිල් කිරීම් වලින් 88.5% ක් එම වර්ෂයේම අයකරගෙන ඇති අතර ඉතිරියද මේ වන විට අයකර ගෙන ඇත.
හිඟ වරිපනම් අය කර ගැනීම සඳහා වරෙන්තු නිකුත් කිරීමක් කර නොතිබුණි.	වරෙන්තු නිකුත් කිරීමට තරම් ප්‍රමාණවත් ශේෂයක් නොමැති නිසා වරෙන්තු නිකුත් කර නොමැති අතර 2023 වර්ෂයේ 12.31ට තිබූ හිඟ වරිපනම් ශේෂය වන රු. 107,871.95 න් රු. 91,131.43ක මුදලක් 2024 වර්ෂය අවසාන වන විට අය කරගෙන ඇත. ඉතිරි හිඟ ශේෂයද අය කර ගැනීම මේ වන විට සිදු කර ඇත.

ජේ.එල්.බී. සමම් ප්‍රභා
ලේකම්,
කොටපොල ප්‍රාදේශීය සභාව
දෙනියාය

චමින්ද ගුණසේකර
සභාපති,
කොටපොල ප්‍රාදේශීය සභාව,
දෙනියාය.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම - කොටපොල ප්‍රාදේශීය සභාව

රජයේ ගිණුම්කාරක සභාව විසින් කාර්යසාධන ඇගයීම ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා	ගෙන ඇති ක්‍රියාමාර්ග
දෙවැනි කොටස : 60.00	
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වා ගෙන ගොස් නොතිබුණි.	2024 වර්ෂයේ සිට ප්‍රසම්පාදන කමිටු අනුමත ආයතනයක් මඟින් වෙබ් අඩවිය නිර්මාණය කරන ලද අතර මේ වන විට වෙබ් අඩවියට ප්‍රවේශ වීමට කටයුතු සිදු කර ඇත.
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	වෙබ් අඩවිය නිර්මාණය අවසන් වූ පසු අවස්ථාව සලසා දෙනු ලැබේ.
හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක නියම කර නොතිබුණි.	2024 වර්ෂයේ සිට තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක සහිතව සකස් කර ඇත.
ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩ පිළිවෙලක් නොතිබුණි.	2024 වර්ෂයේ සිට එම ද්‍රව්‍ය රැගෙන යන තෙක් ආරක්ෂිතව ගබඩා කර තබා ඇත.
